**සීමාසහිත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2024**

---

සීමාසහිත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ (“සමාගම”) 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මෙහෙයුම් කටයුතු පිළිබඳව 2007 අංක 07 දරන සමාගම් පනත සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2007 අංක 07 දරන සමාගම් පනතේ 150(1) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු 2020 වර්ෂයේ සිට 2024 දක්වා වූ මූල්‍ය ප්‍රකාශන 2025 නොවැම්බර් 10 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

සමාගමේ මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්ව සඳහා වන මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම මණ්ඩලයේ වගකීම වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකිරීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 16 දිනැති හා අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදුන් මෙහෙයුම් අත්පොතෙහි 6.6 වගන්තිය පරිදි ගිණුම් වර්ෂය ඉකුත් වී දින 60 ක් ඇතුළත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සීමාසහිත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව විසින් 2020, 2021, 2022, 2023 සහ 2024 යන වර්ෂයන්ට අදාළ මූල්‍ය ප්‍රකාශන 2026 මාර්තු 20 දක්වාම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වර්ෂය සඳහා, 2025 නොවැම්බර් 13 දින වන විට පිළියෙල කර ඇති කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනවල අදාළ සංශෝධනයන් සිදු කරමින් පවතින අතර, 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති වාර්තාව ලද පසු 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ලබා දීමට සැලසුම් කර ඇත.<br><br>තවද 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාළ දත්ත ගිණුම් පිළියෙළ කිරීමට අදාළ මෘදුකාංගය වෙත ඇතුළත් කරමින් පවතී. එම දත්ත ඇතුළත් කිරීමෙන් පසු පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශන 2026 පෙබරවාරි 16 වන දින විගණකාධිපති වෙත භාර දීමට සැලසුම් කර ඇත.<br><br>ඉන් අනතුරුව 2022, 2023, හා 2024 වර්ෂවලට අදාළ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළිවෙලින් 2026 මැයි 15, 2026 ජූලි 30 හා 2026 ඔක්තෝබර් 15 දිනයන් තීදී අවසන් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත වාර්ෂිකව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1 පවත්නා වත්කම් හා වගකීම්

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම විසින් 2019 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාගමේ වත්කම් රු.මිලියන 565 ක් ද, වගකීම් රු.මිලියන 1,670 ක් ද , හිමිකම් රු.මිලියන (1,105) ක් ද, ආදායම් රු.මිලියන 746 ක් ද හා වියදම් රු.මිලියන (304) ක් ද විය. | එකඟ වී ඇත. | සමාගමේ වත්කම් කාර්යක්ෂමව උපයෝජනය කිරීමට හා වගකීම් පියවා මූල්‍ය පිරිවැය අවම කර ලාභය වර්ධනය කර ගැනීමට කළමනාකරණය මෙහෙයුම් කටයුතු සැලසුම් කළ යුතුය. |
| (ආ) | සමාගමේ 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ශුද්ධ ලාභ අනුපාතය (-17) සිට (-21) දක්වා අඩු වී තිබුණි. | එකඟ වී ඇත. | සමාගමේ ලාභ අනුපාතය ක්‍රමානුකූලව උපායමාර්ගිකව ඉහළ නංවා ගැනීම සඳහා කළමනාකරණය පියවර ගත යුතුය. |

### 2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2024 දෙසැම්බර් 31 දිනට වර්ෂ 03 කට වැඩි කාලයක් ගත වූ ලැබිය යුතු මුදල් රු.මිලියන 82.32 ක් ද, ගෙවිය යුතු බැරකම් රු.මිලියන 94.81 ක් ද විය. | එකඟ වී ඇත. | ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් කර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

#### 2.2.1 දිගුකාලීන හා කෙටිකාලීන ණය

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාගැනීමේ අරමුණින් රුපියල් මිලියන 150 ක කෙටිකාලීන ණය මුදලක් 2017 මාර්තු 02 දින සිට 2018 අප්‍රේල් 10 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ අවස්ථා 03 කදී මහජන බැංකුවෙන් ලබා ගෙන තිබුණි. ණය ලබා ගැනීමේ අරමුණින් බැහැරව වෙනත් වියදම් දැරීම හේතුවෙන් මෙම ණය මුදල නියමිත පරිදි පියවීමට සමාගම අපොහොසත් වී තිබුණු අතර 2025 මැයි 31 දිනට | දුර්වල මූල්‍ය තත්ත්වය මත නව ගෙවීම් සැලැස්මක් මේ වන තෙක් ලබා දී නොමැත. 2022 ජනවාරි 28 දින සිට 2025 මැයි 26 දින දක්වා මාසිකව රු.මිලියන 0.5 ක් බැගින් වාරික වශයෙන් ගෙවීමට කටයුතු කර ඇත. 2025 මැයි මාසය වන විට රු.මිලියන 20 ක් ගෙවීම් කර ඇත. | ලබාගත් ණය මුදල් අපේක්ෂිත අරමුණු වෙනුවෙන් යෙදවිය යුතු අතර ණය ආපසු ගෙවීම් ගිවිසුම්ගත පරිදි |

| | | | |
|---|---|---|---|
| | උපචිත වූ පොලියද සමඟ මුළු හිඟ මුදල රු.මිලියන 264.10 ක් වී තිබුණි. 2022 ජනවාරි 18 දින සිට මසකට රු.මිලියන 0.5 ක් බැගින් ගෙවීමට සමාගම එකඟ වූවද එය ණය ප්‍රමාණය අනුව ප්‍රමාණවත් නොවන බැවින් පිළිගත හැකි නැවත ගෙවීමේ සැලැස්මක් 2022 දෙසැම්බර් 25 ට පෙර ලබාදෙන ලෙසත් 2022 දෙසැම්බර් 02 දිනැති ලිපිය මඟින් මහජන බැංකුවේ සහකාර සමානාධිකාරී විසින් දන්වා එවා තිබුණි. එසේ වුවද සමාගම විසින් එවැනි සැලැස්මක් ලබාදී නොතිබුණු අතර මසකට රු.මිලියන 0.5 ක් බැගින් ගෙවීම් කර තිබුණි. | | සිදු කළ යුතුය. |
| (ආ) | වත්මන් මූල්‍ය දුෂ්කරතා ජයගනිමින් සීඝ්‍රයෙන් වර්ධනය වන ඉදිකිරීම් කර්මාන්තයේ ශක්තිමත් පාර්ශවකරුවකු වීමට සමාගමට හැකි වනු පිණිස භාණ්ඩාගාර ඇපයක් මත 2018 මාර්තු 28 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් ලංකා බැංකුව විසින් රු.මිලියන 500 ක ණය මුදලක් 2018 ඔක්තෝබර් 23 දින සමාගම වෙත ලබා දී තිබුණි. ඉන් ලංකා බැංකුවට අයවීමට ඇති රු.මිලියන 199.05 ක මුදලක් අඩුකර ගෙන ලබා දුන් ඉතිරි මුදල වන රු.මිලියන 301.38 න් සියයට 21 ක පමණ මුදලක් එනම් රු.මිලියන 105.98 ක් ණය ලබා ගැනීමේ අරමුණට පටහැනිවූ සේවක වැටුප් ඇතුළු පරිපාලන වියදම්, බැංකු අයිරා පියවීම්, බැංකු ගාස්තු ගෙවීම් සහ ණය පොලි ආදී වියදම් වෙනුවෙන් 2018, 2019 වර්ෂයන්හීදී වැය කර තිබුණි. මෙම රු.මිලියන 500 ක ණය මුදලේ 2025 ඔක්තෝබර් 02 දිනට හිඟ පොලී මුදල රු.මිලියන 426.31 ක් වී තිබුණි. එමෙන්ම අවුරුදු 05 ක ණය සහන කාලය 2023 ඔක්තෝබර් 23 දින අවසානව පැවති අතර ඉන්පසු ණය මුදලෙහි ප්‍රාග්ධන කොටස නියමිත පරිදි ගෙවිය යුතුව ඇතත් ණය ආපසු ගෙවීම හෝ ඒ සම්බන්ධයෙන් ගෙවීම් සැලැස්මක් හෝ ඉදිරිපත් කර නොතිබුණි. | රු.මිලියන 500 ක ණය මුදල සම්බන්ධව 2025 ඔක්තෝබර් 02 දිනට බැංකු ශේෂ සනාතන පරිදි ණය මුදල රු.මිලියන 500 ක් හා පොලී මුදල රු.මිලියන 426.31 ක් වේ.<br><br>මේ සම්බන්ධයෙන් 2025 මැයි 15 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්මේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සමඟ පැවති සාකච්ඡාවේ දී ලබා දුන් උපදෙස් අනුව වසර 05 ක නව ව්‍යාපාර සැලැස්මක් සකස් කර එම සැලැස්ම ක්‍රියාත්මක කිරීම සහ ආයතනයේ ණය මුදල් ගෙවා දැමීමට ආයතනය සතු වත්කමක් විකුණා මූල්‍යනය කර ගැනීමට සැලැස්මක් සකස් කරනු ඇත. | ලබාගත් ණය මුදල් අපේක්ෂිත අරමුණු වෙනුවෙන් යෙදවිය යුතු අතර ණය ආපසු ගෙවීම් සඳහා නිසි සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

### 2.2.2 භාණ්ඩ මිලදී ගැනුම්

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 ජනවාරි 30 දිනැති අංක 296/4/a දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව නිළධාරීන් 05 බැගින් සමන්විත කමිටු 02 ක් | මේ වන විට රේඛීය අමාත්‍යාංශය මඟින් පත් කළ කමිටුවක් මඟින් ප්‍රසම්පාදන | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ප්‍රසම්පාදන කමිටු |

| | | | |
|---|---|---|---|
| | පත්කර ගනිමින් ප්‍රසම්පාදන තීරණ ගැනීම සඳහා 2022 දෙසැම්බර් 02 දින අංක ගොදුස/සභා/අමා.කා/සිඩ් 22 දරන ලිපියෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ඉල්ලා තිබුණි. 2023 මාර්තු 01 දිනැති අංක PDF/PMD/Clari/2023/UD & H/03 දරන ලිපිය මඟින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ ඊට අදාළ අතිරේකයන්ට අනුකූලව කටයුතු කරන ලෙස දන්වා තිබුණි. අංක සීඒඊ/ඒ/බීඑම්සී/ටිආර්/2022/01 දරන විගණන විමසුම මඟින්ද මේ බව වාර්තා කර තිබුණද තව දුරටත් ප්‍රසම්පාදන කටයුතු එම නීත්‍යානුකූල නොවන කමිටු මඟින්ම සිදු කරමින් පැවතුණි. | කටයුතු සිදු කරනු ඇත. | පත්කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (අ) හා 2.8.4 ට අනුව ප්‍රසම්පාදන විෂයන්ට අදාළ විශේෂඥයෙකුගේ ඇගයීම් ලබා ගැනීමට හැකි වන පරිදි සියලු ප්‍රසම්පාදන සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු පත්කර තිබිය යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. | මේ වන විට ප්‍රසම්පාදන තීරණ ගැනීම උදෙසා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පිහිටුවා ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ප්‍රසම්පාදන කටයුතු සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු පත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුව සෑම රාජ්‍ය ආයතනයක්ම ප්‍රසම්පාදන ඒකකයක් ලෙස ජාතික විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතියෙහි ලියාපදිංචි වී ඒ අනුව කටයුතු කළ යුතුව තිබුණද සමාගම අදාළ විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. | මේ වන විට විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතියෙහි ලියාපදිංචි වීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී. | චක්‍රලේඛ උපදෙස් පරිදි ජාතික විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතියේ ලියාපදිංචි වී ප්‍රසම්පාදන කටයුතු ඒ අනුව සිදු කළ යුතුය. |
| (ඈ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 (ඇ) ඡේදය අනුව ප්‍රසම්පාදන අස්ථිත්වයේ ප්‍රධානියා විසින් පත් කරනු ලබන අවම සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් හරහා සැපයුම්කරුවන් ඇගයීම් කොට සැපයුම්කරුවන්ගේ ලැයිස්තුව පිළියෙළ කළ යුතු වුවද එවැනි ක්‍රමවේදයක් අනුගමනය කළ බවට සාක්ෂි නොවීය. | 2026 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේදී ප්‍රසම්පාදන අත්පොතේ 3.4.3(ඇ) අනුව කටයුතු සිදු කරනු ඇත. | ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 3.4.3 (ඇ) ඡේදය අනුව සැපයුම්කරුවන් ලියාපදිංචි කර ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු විධිමත් කළ යුතුය. |
| (ඉ) | 2025 ජනවාරි 27 දින පුවත්පත් දැන්වීම් පළකර 2025 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කරගෙන තිබුණද 2023/ 2024 වර්ෂයන්හි ලියාපදිංචි සැපයුම්කරුවන්ද පසු අවස්ථාවල | මෙම සැපයුම්කරුවන් ලියාපදිංචිය සීමා සහිත බැවින් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම අරමුණුකොට ගෙන දිගු | සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීම නිසි ක්‍රමවේදයකට |

| | | | |
|---|---|---|---|
| | නැවත ලියාපදිංචි කරගනිමින් ඔවුන්ගෙන් මිලදී ගැනීම් කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය. | කාලීනව ආයතනය වෙත සැපයුම් කරන ලද පෙර ලියාපදිංචිව සිටින ලද සැපයුම්කරුවන් ලියාපදිංචිය අලුත් කර නැවත ඇතුළත් කරගෙන ඇත. | අනුව සිදු කළ යුතුය. |

**2.2.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය සමාගමක රථගාල ඉදිකිරීම් කටයුතු සඳහා ග්‍රවෙල් පස් කියුබ් 6,000 ක් හා ඒබීසී මිශ්‍රණ සැපයීමට සැපයුම්කරුවන් තෝරා ගැනීමට අදාළ ප්‍රසම්පාදන කමිටු තීරණය ලබා දීමට පෙර සැපයුම්කරු තෝරාගෙන තිබූ බව නිරීක්ෂණය විය. එසේම එම සැපයුම්කරු ලියාපදිංචි කර තිබුණේ මිල ගණන් ඉදිරිපත් කිරීමෙන් පසුව බවද නිරීක්ෂණය විය. තවද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේක 35 අනුව ප්‍රසම්පාදන වටිනාකම මත ප්‍රසම්පාදන ක්‍රමය තෝරාගත යුතුව තිබුණද පළමුව ලද පස් කියුබ් 6,000 ක් සැපයීම අදියර 07 ක් ඔස්සේ ද, කියුබ් 2,120 ක් සැපයීමේ දෙවන ඇනවුම අදියර 03 ක් වශයෙන්ද කුඩා කොටස්වලට බෙදමින් සුළු ප්‍රසම්පාදන කමිටු තීරණ මඟින් මිලදී ගෙන තිබුණි. ඒ අනුව සම්පූර්ණ ප්‍රසම්පාදන වටිනාකම ඇස්තමේන්තු කර ප්‍රසම්පාදන අධිකාරී සීමාව අනුව අදාළ ප්‍රසම්පාදන කමිටුව මඟින් තීරණ ලබාගෙන මිලගණන් කැඳවා නොතිබුණි. ඒ අනුව අවස්ථා 12 කදී ග්‍රවෙල් පස් කියුබ් 8,870 ක් සහ ඒ.බී.සී. මික්ස් කියුබ් 630 ක් සැපයීම වෙනුවෙන් රු.මිලියන 93.26 ක මුදලක් සැපයුම්කරුවන් වෙත ගෙවීම් කර තිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8 ඡේදය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුවක් ද පත්කර නොතිබුණි. සැපයුම්කරු මඟින් ලබා ගත් පස් තත්ත්ව පරික්ෂණ වාර්තා පමණක් පදනම් කර පස් සැපයීම සිදු කර තිබූ බැවින් ප්‍රමිතියෙන් යුත් ටයිප් 01 වර්ගයේ ග්‍රවෙල් පස් සැපයීම් කර තිබූ බවට විගණනයට සෑහීමකට පත්විය නොහැකි විය. | ප්‍රසම්පාදන කමිටු තීරණය ලබාගැනීම සඳහා ප්‍රමාද කර ඇත්තේ අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද ලංසුකරුගේ මූලික පස් සාම්පල වාර්තාව ලබා ගැනීමෙන් අනතුරුව ප්‍රසම්පාදන කමිටු වාර්තාවට අනුමැතිය ලබා දීම සඳහාය.<br><br>මුල් මිලදී ගැනීමේ ඇණවුම කියුබ් 6,000 කට ලබා දුන්නද පාරිභෝගිකයාගේ අවශ්‍යතාවය මත පස් කියුබ් 6,000 ක් සඳහා මිලදී ගැණුම් ඇණවුම් 07 ක් ඔස්සේ ද දෙවන අදියර සඳහා ඇණවුම් 03 ක් ඔස්සේ ද සැපයුම්කරු වෙතින් පස් ලබා ගෙන ඇත.<br><br>අවස්ථා ගණනාවකදී පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් වාර්තා ලබා දී ඇති අතර මෙම පස් ටයිප් 01 ග්‍රෙවල් සොයිල් බවට නිර්දේශ කර ඇත. ආයතනයේ තාක්ෂණික ඇගයීම් කමිටුවක් මින් පෙර පත් කර නොතිබූ බවට ද එකඟ වන අතර මේ වන විට 2025 වර්ෂයට තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව මූල්‍ය සීමාවන්ට යටත්ව සම්පූර්ණ අවශ්‍යතාවය ඇස්තමේන්තු කර ප්‍රසම්පාදන කමිටු සහ තාක්ෂණික ඇගයීම් කමිටු පත්කර ඒ අනුව සැපයුම්කරුවන් තෝරා ගැනීම සිදු කළ යුතුය. අදාළ තත්ත්ව පරික්ෂාවන් ද නිවැරදිව කාලීනව සිදුකරවා ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | ඉහත (අ) හි සඳහන් ප්‍රසම්පාදනය සිදු කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගොපදේශ සංග්‍රහයේ 3.4.3 (ඇ) අනුව ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ මිලට ගැනුම් සිදු කිරීමේදී ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ලියාපදිංචි ලේඛනයේ ඇතුළත් ආයතන පමණක් තෝරාගත | සැපයුම්කරුවන් 05 දෙනෙකු පමණක් ලියාපදිංචිව සිටි බැවින් පෙර වර්ෂ වල දී ආයතනයේ ලියාපදිංචිව සිටි සැපයුම්කරුවන් හරහා ද, මෙම ඇණවුම සඳහා | සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීම විධිමත් කළ යුතු අතර ඒ අනුව ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීමට කටයුතු |

| | | | |
|---|---|---|---|
| | යුතු වුවද, ප්‍රසම්පාදනය සඳහා සලකා බලන ලද සැපයුම්කරුවන් 08 දෙනාගෙන් තිදෙනෙකු සමාගමේ ලියාපදිංචිව ඇති බවට සාක්ෂි නොතිබුණි. | මිල ගණන් ලබාගෙන ඇත | කළ යුතුය. |
| (ඇ) | සමාගම වැට් සඳහා ලියාපදිංචි වී ඇති ආයතනයක් වුවද ඉහත ප්‍රසම්පාදනයට අදාළ පස් අලෙවි කිරීමේදී TAX Invoice වෙනුවට Sales Invoice නිකුත් කොට තිබුණි. 2024 වර්ෂයේදී සිදු කළ මුළු විකුණුම් වටිනාකම රු.මිලියන 95.13 ක් වෙනුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂනය කළ යුතුව පැවති වැට් බදු වටිනාකම රු.මිලියන 17.12 ක් වී තිබුණි. | මෙතෙක් සම්බන්ධ ආයතනික ක්‍රමවේදය වූයේ ආයතනයට සැපයුම් කරන ලද භාණ්ඩ වෙනුවෙන් වැට් සඳහන් ඉන්වොයිස් පතක් ලැබේ නම් එයට අදාළ අයිතම ඉන්වොයිස් කිරීමේදී පමණක් ඒ සඳහා වැට් ඉන්වොයිස් පත් නිකුත් කිරීමයි. මෙම සැපයුම් සඳහාද එම ක්‍රමවේදයම භාවිත කර ඇත. | වැට් සඳහා ලියාපදිංචි ආයතන වෙත භාණ්ඩ අලෙවි කිරීමේදී TAX Invoice නිකුත් කර වැට් බදු අයකර ගැනීමට හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාගමේ අරමුණුවලින් බැහැරව වර්ෂය තුළදී රු.මිලියන 2.94 ක් වූ ගොඩනැගිලි ද්‍රව්‍ය නොවන භාණ්ඩ අතරමැදි පාර්ශවයක් ලෙස මිලදී ගෙන රාජ්‍ය ආයතන වෙත විකුණා තිබුණි. | අදහස් දක්වා නොමැත. | සමාගමේ අරමුණුවලට අදාළ මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඉ) | අංක 2024/TR/249 හා 2024/TR/372 දරන ගැණුම් ඇණවුම් මගින් අඩු මිල ගණන් ඉදිරිපත් කර තිබූ සමාගම් වෙනුවට ණය පදනම මත වැඩි මිල ගණන් යටතේ භාණ්ඩ සපයන ආයතන තෝරාගෙන තිබීම තුළින් සමාගමට මූල්‍ය අලාභයක් සිදු වී තිබුණි. | ආයතනයේ පැවති මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් ආයතනය පවත්වාගෙන යාම සඳහා 2024/TR/249 දරන ඇනවුම සඳහා හා 2024/TR/372 දරන ඇනවුම සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනය වෙනුවට මූලිකවම අවම මිලට අමතරව ණය පදනම මත ලබා දීම, ණය කාල සීමාව, ප්‍රවාහන පහසුකම් සැලසීම ආදී සියලු කාරණා සැලකිල්ලට ගනිමින් ප්‍රසම්පාදන තීරණ ලබා දී ඇත. | සමාගමට වඩාත් වාසිදායක වන අයුරින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව සැපයුම්කරුවන් තෝරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | සැපයුම්කරුවන් සඳහා ගෙවීම් කිරීමේදී ඉන්වොයිස්පත්, භාණ්ඩ ලැබීම් පත්‍රිකා, මිලට ගැණුම්, ඇණවුම් සියල්ල පරීක්ෂා කර ගෙවීම් වවුචරය පිළියෙල කොට පරීක්ෂා කර මුදල් ගෙවීම සඳහා අනුමැතිය ලබා දිය යුතු වුවද නියැදි පරීක්ෂාවේදී සමාගම විසින් ඊට පටහැනිව භාණ්ඩ ලැබීමට පෙර ගැණුම් ඇණවුම් සමඟ මුදල් එකවර ගෙවා තිබුණි. | ආයතනය විසින් එදිනෙදා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා ගැනුම් ඇණවුම සමඟ මුදල් ගෙවීම සිදු කර ඇත. බැංකු ඇපකර ලබා දීමට නොහැකි වීම නිසා සහ ණය පදනම මත ලබා ගත් භාණ්ඩ වෙනුවෙන් සැපයුම්කරුවන් වෙත තව දුරටත් මුදල් ගෙවීමට | මිලදී ගැනීම් සඳහා ගෙවීම් කිරීමට අනුමැතිය ලබා දීමේදී භාණ්ඩ ලැබී ඇති බවට තහවුරු කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | | පැවතීම යන කරුණු හේතුවෙන් ණය පදනම මත භාණ්ඩ ලබා ගැනීමට නොහැකි වී ඇත. |

### 2.2.4 භාණ්ඩ විකුණුම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 වර්ෂය සඳහා සංස්ථාවේ ගිණුම් අංශයෙන් ඉදිරිපත් කළ වාර්තාවට අනුව විකුණුම් ආදායම රු.මිලියන 261.60 ක් වූ අතර අලෙවි අංශයෙන් ඉදිරිපත් කළ වාර්තාවට අනුව විකුණුම් ආදායම රු.මිලියන 254.36 ක් විය. ඒ අනුව මෙම අංශ දෙක අතර විකුණුම් ආදායමේ රු.මිලියන 7.24 ක වෙනසක් නිරීක්ෂණය විය. | අලෙවි අංශයෙන් ලද විකුණුම් දත්ත සහ මූල්‍ය අංශයේ ගිණුම් ගත කරන ලද විකුණුම් දත්ත අතර පවතින වෙනස තහවුරු කර ගැනීම සඳහා අදාළ සැසඳුම් සිදු කෙරෙමින් ඇත. | නිවැරදි විකුණුම් ආදායම ගණනය කර ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීම් නොපමාව සිදුකළ යුතුය. |
| (ආ) | අලෙවි අංශයේ වාර්තා අනුව අලෙවි මධ්‍යස්ථාන 15 ක 2023 වර්ෂයේ විකුණුම් ආදායම වූ රු.මිලියන 357.65 ට සාපේක්ෂව 2024 වර්ෂයේ විකුණුම් ආදායම රු.මිලියන 114.06 ක් වූ අතර ආදායම අඩුවීම රු.මිලියන 243.58 ක් වී තිබුණි. | එකඟ වී ඇත. | ආදායම් අඩුවීමට අදාළ හේතු හඳුනාගෙන විකුණුම් ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 2.3 අලෙවි මධ්‍යස්ථාන අලාභ තත්ත්වයෙන් පවත්වාගෙන යාම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 වර්ෂයේ සමාගමේ අලෙවි මධ්‍යස්ථාන වලට අදාළව මාසික ගිණුම් වාර්තා සකස් කර නොතිබීම හේතුවෙන් එක් එක් අලෙවි මධ්‍යස්ථානයන්හි ලාභ අලාභ හඳුනා ගැනීමට නොහැකි වූ අතර 2025 ජනවාරි සිට ජූනි 30 දින දක්වා මාසයන්ට අදාළව ඉදිරිපත් කළ තොරතුරු අනුව අලෙවි මධ්‍යස්ථාන 17 ක් අලාභ ලබමින් පැවතුණි. | එකඟ වී ඇත. | අලෙවි මධ්‍යස්ථාන වලට අදාළව මාසික ගිණුම් වාර්තා සකස් කිරීමට හා විකුණුම් ප්‍රවර්ධනය තුළින් ආදායම් ඉහළ නංවාගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.4 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ ටයිල් ආනයන ව්‍යාපෘතිය යටතේ 2021 සැප්තැම්බර් සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා රු.මිලියන 2,924.73 ක විකුණුම් ආදායමක් ලබා තිබුණු අතර 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ අයකර ගත් එකතු කළ අගය මත බදු ලෙස රු.මිලියන 129.59 ක් ගෙවිය යුතු බවට ගණනය කර තිබුණද විගණිත දිනය වූ 2025 අගෝස්තු 15 දින දක්වා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට එම බදු ප්‍රේෂණය කර නොතිබුණි. | 2022 සහ 2023 වර්ෂ සඳහා වන වැට් බදු වාර්තා සකස් කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම 2025 වර්ෂය තුළදී සිදු විය. එම වාර්තා අනුව 2022 වර්ෂය සඳහා රු.මිලියන 112.44 ක් සහ 2023 වර්ෂය සඳහා රු.මිලියන 6.35 ක් ලෙස රු.මිලියන 118.79 මුදලක් ගෙවිය යුතුව ඇත. එසේ වෙතත්, ආයතනයේ පවතින දුර්වල මූල්‍ය තත්ත්වය හේතුවෙන් මේ වන විට මෙම මුදල ගෙවීමට නොහැකි වී ඇත. | එකතු කළ අගය මත බදු පනත යටතේ අයකර ගත් බදු නිසි පරිදි දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතුය. |
| (ආ) | ඉහත බදු පනතෙහි 21 (1) වන ඡේදය අනුව සෑම බදු අයකළ හැකි කාල සීමාවක් අවසන් වූ පසු ඊළඟ මස අවසන් දිනට පෙර හෝ ඊට පෙර බදු වාර්තා දේශීය ආදායම් කොමසාරිස් වෙත භාර දිය යුතු වුවද සමාගම විසින් 2024 වර්ෂය සඳහා වන බදු වාර්තා විගණිත දිනය වූ 2025 අගෝස්තු 28 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | වාර්තා කරන දිනට 2022 සහ 2023 වර්ෂ සඳහා වන එකතු කළ අගය මත බදු වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර 2024 වර්ෂ සඳහා වන එකතු කළ අගය මත බදු වාර්තා 2025 නොවැම්බර් මස අවසන් වීමට ප්‍රථම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | එකතු කළ අගය මත බදු පනත ප්‍රකාරව බදු වාර්තා නියමිත දින වලදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | 2009 අංක 15 දරන එකතු කළ අගය මත බදු (සංශෝධිත) පනත මඟින් සංශෝධනය කරනු ලැබ ඇති 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතෙහි 22 (6) (iii) සහ (iv) වන ඡේදයන් අනුව දේශීය මිලට ගැනුම් සඳහා ගෙවන එකතු කළ අගය මත බදු සඳහා ඉන්වොයිස් දිනයේ සිට මාස 12 ක කාලයක් සහ ආනයන සඳහා මාස 24 ක කාලයක් තුළ ඒ සඳහා වන ආදායම් බදු ප්‍රකාශ පත්‍රය ඉදිරිපත් කළ යුතු වේ. එහෙත් එසේ සිදුකර නොතිබූ බැවින් පෙර ගෙවූ බදු (යෙදවුම් බදු), කාල සීමාව තුළ සිදු කරන ලද විකුණුම් වෙනුවෙන් ගෙවිය යුතු බදු රු.මිලියන 90 ක් අඩු කර ගැනීම සඳහා තිබූ අවස්ථාව අහිමි වී තිබුණි. එපරිදි, 2021, 2022 සහ 2023 වර්ෂ වලදී ටයිල් ආනයන සඳහා පිළිවෙලින් ගෙවා තිබූ රු.මිලියන 61.41, රු.මිලියන 60.13 ක් සහ රු.මිලියන 1.74 ක එකතු කළ අගය මත බදු එකතුව | එකඟ වී ඇත. | වැට් බදු වාර්තා අදාළ කාල සීමාවන් තුළදී භාර දීමට කටයුතු නොකළ වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතු අතර ඉදිරියේදී සිදු විය හැකි අලාභ තත්ත්වයන් වළක්වා ගැනීමට නොපමාව කටයුතු කළ ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.මිලියන 123.28 ක් වූ අතර වාර්තා භාර නොදීම මත එම වටිනාකම් ද සමාගම වෙත අහිමි වී තිබුණි. | | |
| (i) | 2021 වර්ෂය සඳහා පමණක් රු.මිලියන 28.66 ක් වූ දේශීය මිලට ගැනුම් මත වැට් බදු සමාගමට අහිමිව තිබුණු අතර තව දුරටත් 2024 අගෝස්තු 30 දක්වා දේශීය ගැනුම් සඳහා ගෙවන ලද බදු මුදල්ද අඩු කර ගැනීමට නොහැකිව තිබුණි. ඒ අනුව 2021 වර්ෂය සඳහා ප්‍රකාශ කරන ලද දේශීය ගැනුම් සහ මේ දක්වා සිදු කරන ලද ආනයන මත ගෙවන ලද මුළු වැට් බදු වටිනාකම වූ රු.මිලියන 151.94 ක් සමාගමට අහිමි වී තිබුණි. | එකඟ වී ඇත. | -එම- |
| (ඈ) | එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි සමාගමක් විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නියම කළ බදු නිදහස් යටතට ගැනෙන අයිතම හැර අනෙකුත් අයිතම විකුණුම් සඳහා වැට් ඉන්වොයිස් නිකුත් කළ යුතු වුවද සිමෙන්ති, යකඩ සහ ටයිල් විකුණුම් පමණක් බද්දට යටත් ආදායම ලෙස ගණනය කර තිබුණු අතර ෂීට් සහ අනෙකුත් අයිතම විකුණුම් වැට් ඉවත් කළ සැපයුම් ලෙස වැට් වාර්තාවන්හි සටහන් කර තිබුණි. විගණනය විසින් විමසීමේදී වැට් සහිත සැපයුම්කරුවන්ගෙන් මිලට ගන්නා භාණ්ඩ විකුණුම් සඳහා පමණක් වැට් ගෙවීම් සිදු කරන බව ප්‍රකාශ කරන ලදී. ඒ අනුව එකතු කළ අගය මත බදු පනතට පටහැනිව කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව වැට් ගෙවිය යුතු රු.මිලියන 2,233.56 ක විකුණුම් ආදායමක් වැට් ඉවත් කළ සැපයුම් ලෙස දක්වා වැට් අය කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණු අතර ඒ අනුව රු.මිලියන 178.68 වැට් බදු ආදායමක් 2021 වර්ෂය සඳහා රජයට අහිමි වී තිබුණි. | ආයතනය විසින් වැට් බදු ගණනය කිරීමේදී පෙර වර්ෂ වල සිටම මෙම ක්‍රමවේදයම අනුගමනය කර ඇත. ආයතනයේ සැපයුම්කරුවන් බහුතරයක් වැට් සඳහා ලියාපදිංචි වී නොමැති බැවින් සාමාන්‍ය පාරිභෝගිකයන් වෙත භාණ්ඩ විකිණීමේදී වැට් අගය එකතු කර භාණ්ඩ විකිණීම කළ යුතු අතර ඒ අනුව සාමාන්‍ය පාරිභෝගිකයන් හට මිල වැඩිවීමක් සිදු වනු ලබයි. ඒ අනුව අනිකුත් සැපයුම්කරුවන්ගේ මිල ගණන් සමඟ විශාල වෙනසක් පවතින බැවින් මෙම ක්‍රමවේදය අනුගමනය කර ඇත. නමුත් නිවැරදි ක්‍රමවේදය අනුව වැට් බදු ගණනය කිරීම සඳහා කළමනාකාරීත්වය සමඟ සාකච්ඡා කර නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | 2009 අංක 15 දරන එකතු කළ අගය මත බදු (සංශෝධිත) පනතට අනුව බදු නිදහස් අයිතම හැර අනෙකුත් විකුණුම් අයිතම් සඳහා වැට් ඉන්වොයිස් නිකුත් කර වැට් අයකිරීම් කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතුය. |
| (ඉ) | 2003 අංක 07 දරන එකතු කළ අගය මත බදු (සංශෝධිත) පනත මඟින් සංශෝධනය කරනු ලැබ ඇති 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතෙහි 20 (6) වන ඡේදය අනුව යම් කිසි ලියාපදිංචි පුද්ගලයෙකු විසින් ඕනෑම රාජ්‍ය | කළමනාකාරීත්වය සමඟ සාකච්ඡා කර නිවැරදි ක්‍රමවේදයට අනුව වැට් ඉන්වොයිස් නිකුත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරනු ඇත. | බද්දට යටත් සැපයීම් වෙනුවෙන් බදු ඉන්වොයිස් නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |

ආයතනයකට කරනු ලබන ඕනෑම බද්දට යටත් සැපයුමක් සඳහා බදු ඉන්වොයිසියක් නිකුත් කළ යුතු වුවද සමාගම විසින් එවැනි බදු ඉන්වොයිසි නිකුත් නොකරන බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 2.5 වරිපනම් බදු ගෙවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොළඹ මහනගර සභාව වෙත 2007 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා හිඟ වරිපනම් බදු රු.මිලියන 19.24 ක් සහ ඊට අදාළ දඩ මුදල රු.මිලියන 4.35 ක් ගෙවීමට පැවතුණි. 2025 ජුනි 30 දින වන විට හිඟ වරිපනම් බදු හා දඩ මුදල් එකතුව රු.මිලියන 24.17 ක් නිරවුල් කිරීමට පැවති අතර කැලි කසළ ඉවත් කිරීමේ ගාස්තුව රු.මිලියන 0.35 ක් ද ගෙවීමට පැවතුණි. | මූල්‍ය දුෂ්කරතා හමුවේ වුවද 2022, 2023 හා 2024 වර්ෂ වලට අදාළ වරිපනම් බදු මුදල් ගෙවීම් කිරීමට සමාගම කටයුතු කර ඇත. 2025 සැප්තැම්බර් 30 දිනට හිඟ වරිපනම් බදු මුදල රු.මිලියන 24.46 ට අදාළ ගෙවීම් සිදුකිරීම නව පස් අවුරුදු ව්‍යාපාර සැලැස්මට අන්තර්ගත කර එම ගෙවීම් සැලැස්මට අනුව ගෙවීම් සිදු කිරීමට කටයුතු කරනු ඇත. | වරිපනම් බදු නියමිත දිනට පෙර ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මොරටුව මහ නගර සභාව වෙත ගෙවිය යුතු 2008 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා හිඟ වරිපනම් බදු හා දඩ මුදල් එකතුව රු.මිලියන 1.74 ක් සහ මහනුවර මහ නගර සභාව වෙත 2024 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු හිඟ වරිපනම් බදු හා දඩ මුදල් රු.මිලියන 0.16 ක් ගෙවීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | මූල්‍ය දුෂ්කරතා හමුවේ වුවද 2023 වර්ෂයට අදාළ වරිපනම් බදු මුදල් ගෙවීම් කිරීමට සමාගම කටයුතු කර ඇත. 2025 සැප්තැම්බර් 30 දිනට හිඟ වරිපනම් බදු මුදල රු.මිලියන 1.79 ට අදාළ ගෙවීම් සිදුකිරීම නව පස් අවුරුදු ව්‍යාපාර සැලැස්මට අන්තර්ගත කර එම ගෙවීම් සැලැස්මට අනුව ගෙවීම් සිදු කිරීමට කටයුතු කරනු ඇත. | -එම- |

## 2.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා

| | විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දුන් රජය සතු ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතේ 6.7 ඡේදය | 2024 වර්ෂයට අදාළව භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2025 ජුලි 23 වන දින ඉදිරිපත් කර තිබුණද අපහරණය කළ යුතු භාණ්ඩ සම්බන්ධ වාර්තා නොමැති□අතර අපහරණ කටයුතුද සිද□ කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධානයන් ප්‍රකාරව 2024 වර්ෂයට අදාළව භාණ්ඩ සමීක්ෂණ වාර්තා 66 පෝරමය අනුව සකස් කර ප්‍රධාන ලෙජර ශේෂය සහ තත්‍ය ශේෂය අතර වෙනසක් නොතිබු බැවින් අතිරික්තතා/ ඌනතා නොතිබුණි.<br><br>භාණ්ඩ සමීක්ෂණ වාර්තාව | භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ අනුව අපහරණ කටයුතු කඩිනමින් සිදුකිරීමට කළමනාකරණය පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | තුළ අපහරණය කළ යුතු භාණ්ඩ සඳහන් වී පැවතියද ඒවා ඉවත් කිරීම සඳහාවන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2025 වර්ෂයේදී ලැබී තිබූ අතර අපහරණ කටයුතු ඉදිරියේදී සිදු කිරීමට නියමිතව ඇත. | |
| (ආ) | 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය හා 2018 ඔක්තෝබර් 10 දිනැති අංක MF/CG/02/(Cir) දරන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ චක්‍රලේඛය | සමාගම විසින් කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ පිළිබඳ තොරතුරු භාණ්ඩාගාරයේ කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**2.7 දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත් රු.මිලියන 50ක අත්තිකාරම් මුදල ආපසු නොගෙවීම**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2007 සැප්තැම්බර් 27 දිනැති අමප/07/1625/342/021 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කොළඹ 12 ශ්‍රී සංඝරාජ මාවතේ පිහිටි ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට අයත් ඉඩමකින් පර්චස් 100 කින් යුත් බිම් කොටසක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පවරා රු.මිලියන 50 ක අත්තිකාරම් මුදලක් 2008 පෙබරවාරි 22 දින සමාගම වෙත ලබා ගෙන තිබුණද නැවතත් 2012 මැයි 07 දිනැති අංක 12/0446/540/005 දරන අමාත්‍ය මණ්ඩල තීරණයකින් 2007 සැප්තැම්බර් 27 දිනැති ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය අවලංගු කර තිබුණු අතර ලබාගත් අත්තිකාරම් මුදල ආපසු ගෙවිය යුතුව තිබුණි. විගණනය සඳහා අවසන්වරට ඉදිරිපත් කරන ලද 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන්හි ජංගම නොවන බැරකම් යටතේ මෙම ගෙවිය යුතු අත්තිකාරම් මුදල පෙන්නුම් කර තිබුණි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මෙම මුදල නැවත ලබා දෙන ලෙස ඉල්ලීම් කර තිබුණද මෙම රු.මිලියන 50 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | මෙ සම්බන්ධව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හා සමාගම අතර 2023 ජුනි 29 දින පැවති සාකච්ඡා අනුව මෙම මිලියන 50 වෙනුවට කළුතර ශාඛාවට අයත් ඉඩමෙන් පර්චස් 40 ක බිම් කොටසක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පවරා දෙන ලෙසද ඉල්ලා තිබුණු අතර ඒ අනුව ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කරන ලදි. පසුව පවත්වන ලද සාකච්ඡාවකදී කළුතර ඉඩම සමාගමේ ප්‍රයෝජනයට පමණක් ලබා දී ඇති ඉඩමක් බැවින් එම ඉඩම පවරන ආකාරය පිළිබඳව කළමනාකරණ මණ්ඩලය සාකච්ඡා කර, ඉදිරි කටයුතු සැලසුම් කරගන්නා ලෙස යෝජනා වී ඇත. | අත්තිකාරම් මුදල් නිරවුල් කර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

## 2.8 අවිධිමත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2011 මැයි 09 දින අලෙවි සහායිකාවක් ලෙස පත්වීම් ලද සේවිකාවක් 2020 දෙසැම්බර් 14 හා අංක අමප/20/1992/301/015 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2021 ජනවාරි 01 දින සිට ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ සහකාර ලේකම් (වෘත්තීය කටයුතු හා සේවක සබඳතා) ලෙස පත්කර තිබුණි.<br><br>2021 මැයි 09 දිනෙන් එම තනතුර අහෝසි වීමෙන් පසු නැවතත් ඇයගේ නිත්‍ය තනතුරෙහි සේවයෙහි පිහිටුවා තිබුණි. පසුව ඇයව අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ අත්පොතෙහි අංක 3.5 ඡේදයට පටහැනිව අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව, 2022 ජූලි 27 දිනැති සභාපතිගේ ලිපියක් මඟින් 2022 ජූලි 28 දින සිට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණි. කෙසේ වුවද 2022 මැයි සිට 2024 ජූනි 30 දක්වා සමාගම විසින් නිලධාරිනියගේ වැටුප් වශයෙන් රු.මිලියන 1.13 ක් ගෙවා තිබුණි. මෙම මුදල් 2026 මාර්තු 20 දක්වා අමාත්‍යාංශයෙන් ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.<br><br>එසේ තිබියදී අංක 4.1 / 3815 දරන 2024 ජූලි 08 දිනැති ලිපිය ප්‍රකාර එදින සිට නැවතත් සමාගමේ සහකාර කළමනාකරු තනතුරට පත්කරනු ලැබ ඇත.<br><br>එම ලිපියෙහි ත්‍රිපුද්ගල කමිටුවක තීරණයක් මත මෙම පත්වීම කරන ලද බව දක්වා තිබුණද එවැනි කමිටු අනුමැතියක් හෝ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් හෝ විගණනයට ඉදිරිපත් නොවිය. | සහකාර ලේකම් (වෘත්තීය සමිති සේවක සබඳතා) තනතුර 2022 මැයි 09 දිනෙන් අවසන් වූ පසු 2022 ජූලි 25 දින සිට නැවත මෙම ආයතනයේ සේවයට පත් කරන ලදි. අමාත්‍ය කාර්ය මණ්ඩලයට හිටපු සභාපති විසින් යොමු කර ඇති නමුත් අමාත්‍ය මණ්ඩල අනුමැතියක් නොමැති අතර වැටුප ප්‍රතිපූර්ණ කර ගෙන ද නොමැත. පැමිණීමේ ලේඛන නාගරික සංවර්ධන නිවාස අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් විසින් යොමු කර ඇත. 2024 මැයි 03 ත්‍රිපුද්ගල කමිටුවක් පත් කර එහි නිර්දේශ අනුව සහකාර කළමනාකරු තනතුර ලබා දී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් නොමැත. | නිලධාරීන්ට පත්වීම් ලබාදීමේදී හා මුදා හැරීමේදී විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර ඊට අනුකූල නොවූ වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට හා වැටුප් හා දීමනා ප්‍රතිපූර්ණය කර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ආ) | අංක 01/2015(ii) හා 2022 ජනවාරි 14 දිනැති මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව සමාගමෙහි සභාපතිවරයා හට හිමි මාසික ඉන්ධන දීමනාව වන ලීටර් 145 සීමාව ඉක්මවා ඉන්ධන ලීටර් 565 ක් අංක KJ 2654 ජීප් රථයට සමාලෝචිත වර්ෂයේදී නිකුත් කර තිබුණි. ඒ වෙනුවෙන් රු.මිලියන 0.12 ක් වැය කර තිබුණද චක්‍රලේඛයේ 3.2.1 ඡේදය | 2023 මාර්තු මස සිට අංක 01/2015 (ii) හා 2022 ජනවාරි 14 දිනැති මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව සභාපතිවරයාට හිමි ඉන්ධන දීමනාව මුදලින් ගෙවා නොමැති අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ප්‍රවාහන අංශය මඟින් ඉන්ධන සැපයුම් කර ඇත. මාස්පතා නියමිත ඉන්ධන සීමාව ඉක්මවා යන ලීටර් ගණන අධ්‍යක්ෂ | චක්‍රලේඛ ප්‍රතිපාදනවලට අනුකූලව අදාළ තනතුරට හිමි ඉන්ධන ලීටර් ප්‍රමාණය ඉක්මවා ලබා |

| | | | |
|---|---|---|---|
| | ප්‍රකාරව, රාජකාරි ඉටුකිරීම සඳහා මාසික ඉන්ධන දීමනාව ප්‍රමාණවත් නොවන විශේෂ අවස්ථාවන්හිදී අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශ සහිතව අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියක් මත සත්‍ය ඉන්ධන වියදම ප්‍රතිපූර්ණය කළ හැකි වුවද මෙම වියදම් සඳහා එසේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | මණ්ඩලයට ඉදිරිපත් කර ඒ සඳහා අනුමැතිය ලබාගෙන ඇති බවට අනාවරණය වුණි.<br><br>2024 පෙබරවාරි මස සිට අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සණ පූර්ණය නොමැති බැවින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නොපැවැත්වුණු අතර වැඩිවන ඉන්ධන ප්‍රමාණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පවත්වන තෙක් ආවරණ අනුමැතියක් හිටපු සභාපති වරයා විසින් ලබාදී ඇති බවට අනාවරණය වුණි.<br><br>2024 සැප්තැම්බර් මස සිට සභාපතිවරයාට හිමි ඉන්ධන දීමනාව හෝ ආයතනය මඟින් ඉන්ධන අවශ්‍යතාව සපුරාලීම හෝ සිදුකර නොමැති බවට අනාවරණය වුණි .<br><br>2024 අප්‍රේල් මස සිට අගෝස්තු මාසය දක්වා සභාපතිවරයා විසින් ප්‍රතිපූර්ණය කර නොගත් ඉන්ධන දීමනාවේ වටිනාකම රු.77,864 වන අතර ඉහත වැඩිපුර ලබාගත් ඉන්ධන සඳහා වන වටිනාකමෙන් අඩුකළ පසුව වටිනාකම වන රු.741,589 ක් සඳහා වන ලීටර් ප්‍රමාණය රේඛීය අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත්ව නොමැති බව අනාවරණය වුණි.<br><br>මෙම මුදල සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් නොමැත.<br><br>2024/01 විගණන විමසුම සහ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ නිර්දේශ මත 2024 සැප්තැම්බර් මස 01 දින සිට ආයතනය විසින් ඉන්ධන නිකුත්කිරීම අත්හිටුවා ඇති අතර PED 01/2015 (ii) ප්‍රකාරව කටයුතු කිරීම සඳහා පියවර ගෙන ඇත. | ගත් ඉන්ධන සඳහා අවශ්‍ය අනුමැතීන් එම කාලය තුළදී නොපමාව ලබාගත යුතු අතර අනුමැතිය ලබානොගත් ඉන්ධනවල වටිනාකම වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාගමේ විධායක අධ්‍යක්ෂවරයාට හිමි ඉන්ධන සීමාව වන ලීටර් 145 ඉක්මවා 2024 ජනවාරි සිට ජූලි දක්වා ලබා ගත් ඉන්ධන ලීටර් 761 ක් වෙනුවෙන් රු.මිලියන 0.26 ක මුදලක් අනුමැතියකින් තොරව ගෙවීම් කර තිබුණි.<br><br>2024 පෙබරවාරි මාසයෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම් පවත්වා නොතිබුණු අතර මෙම වැඩිපුර ගෙවා ඇති ඉන්ධන ලීටර් ප්‍රමාණය වෙනුවෙන් 2015 මැයි 25 දිනැති අංක පී.ඊ.ඩී. 01/2015 දරන චක්‍රලේඛයේ 3.2.2 වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | 2023 මාර්තු මස සිට අංක 01/2015 (ii) හා 2022 ජනවාරි 14 දිනැති මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව විධායක අධ්‍යක්ෂකට හිමි ඉන්ධන දීමනාව මුදලින් ගෙවා නොමැති අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ප්‍රවාහන අංශය මඟින් ඉන්ධන සැපයුම් කර ඇත. මාස්පතා නියමිත ඉන්ධන සීමාව ඉක්මවා යන ලීටර් ගණන අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ඒ සඳහා අනුමැතිය ලබාගෙන ඇති බවට අනාවරණය වුණි.<br><br>2024 පෙබරවාරි මස සිට අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සණපූර්ණය නොමැති බැවින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නොපැවැත්වුණු | -එම- |

| | | | |
|---|---|---|---|
| | | අතර වැඩිවන ඉන්ධන ප්‍රමාණය සඳහා ආවරණ අනුමැතියක් ලබාදී ඇති බවට අනාවරණය වුණි.<br><br>2024/01 විගණන විමසුම සහ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ නිර්දේශ මත 2024 සැප්තැම්බර් මස සිට ආයතනය විසින් ඉන්ධන නිකුත්කිරීම අත්හිටුවා ඇති අතර PED 01/2015 (II) ප්‍රකාරව කටයුතු කිරීම සඳහා පියවර ගනු ඇත. | |
| (ඈ) | සමාගමේ විකුණුම්, අලෙවි සහ නිෂ්පාදන ධාරිතා වර්ධනය කිරීමේ අරමුණින් ක්ෂේත්‍රයෙහි පලපුරුදු උපදේශකයන් දෙදෙනෙකු පත්කර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. ඒ අනුව 2023 ජුනි 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි නිලධාරින් දෙදෙනෙකු පත්කර තිබූ අතර මාසිකව එක් නිලධාරියෙකුට රු.මිලියන 0.075 ක් බැගින් ගෙවීමට එකඟ වී තිබුණි. ඒ අනුව 2023 ජුනි මස සිට 2024 මාර්තු මස දක්වා කාලය තුළ සමාගම විසින් උපදේශකවරුන් සඳහා රු.මිලියන 1.13 ක දීමනාවක් ගෙවීම් කර තිබුණි. උපදේශකවරුන්ගෙන් ගිවිසුම්ගත පරිදි අපේක්ෂිත සේවා, සැලසුම් හෝ ප්‍රතිලාභයන් සංස්ථාවට ලැබීම පිළිබඳව 2024 අගෝස්තු 21 සහ 2025 ජූලි 24 යන දිනැති තොරතුරු විමසීමේ ලිපි මඟින්, පිළියෙල කළ යුතු සැලසුම් හා මඟ පෙන්වීම් වල ප්‍රගතිය පිළිබඳ තොරතුරු විගණනය වෙත ලබා දෙන ලෙස ඉල්ලා සිටියද 2026 මාර්තු 20 දක්වාම තොරතුරු ලබා දී නොතිබුණි. මේ අනුව එම වියදම් වල ඵලදායිතාව පිළිබඳ විගණනයට ගැටළු සහගත වේ. | එකඟ වී ඇත. | විගණනය සඳහා අවශ්‍ය තොරතුරු නොපමාව ලබාදීමට කටයුතු කළයුතු අතර නිශ්කාර්ය වියදම් වගකිව යුතු පාර්ශවයන්ගෙන් ආපසු අයකර ගැනීමද සිදු කළ යුතුය. |
| (ඉ) | රත්නපුර නව නගර උද්‍යානය ඉදි කිරීමට අවශ්‍ය ඉදිකිරීම් ද්‍රව්‍ය සපයා ගැනීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යාංශය 2024 ජූලි 03 දින අංක CM/DE/7/SP/2024/3 දරන ඇණවුම ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව 2024 ජූලි 10 දින රැස්වී තිබූ ප්‍රසම්පාදන කමිටුව වෙත සමාගමේ ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන් තිදෙනෙකුගෙන් ලබා ගත් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. ගැල්වනයිස් බට මිලට ගැනීමට අදාළව සැපයුම්කරුගෙන් මිල ගණන් විමසීමේදී පිරිවිතරයන් සඳහන් නොකර මිල ගණන් ලබා ගෙන එම මිල ගණන් ඇගයීම් කර | අදහස් දක්වා නොමැත. | විධිමත් ලෙස ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීමට හා නිශ්චිත පිරිවිතරයන් සකස් කර තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ මත මිලදී ගැනීම් |

| | | |
|---|---|---|
| සැපයුම්කරු තෝරාගෙන තිබුණි. වෙළඳපලේ විවිධ ඝණකමින් (Guage) යුතු විවිධ වර්ගයේ G.I බට පවතින බැවින් තාක්ෂණික ඇගයීම් කමිටුවක්ද නොමැතිව ප්‍රසම්පාදන කමිටුව මිල ගණන් ඇගයීම් කර සැපයුම්කරුවකු තෝරා ගත්තේ කෙසේද යන්න විගණනයට ගැටළු සහගත විය.<br><br>තවද අංක 0358 හා 2024 ජූලි 12 දින දරන ගෙවීම් වවුචරය මඟින් රු.මිලියන 0.40 ක මුදලක් 1 ½” × 6m ප්‍රමාණයේ G.I බට 30 ක් මිලට ගැනීමට පුද්ගලික ආයතනයට ගෙවීම් කර තිබුණි. විගණනයේදී ලබා ගත් වෙළඳපල මිල ගණන් අනුව G.I බටයක් රු.4,190, රු.4,400, රු.4,450 සහ රු.5,200 ක් වැනි මිල ගණන් යටතේ අලෙවි වන බව නිරීක්ෂණය වූ බැවින් G.I බටයක් රු.13,350 ක් ලෙස වෙළඳපල මිල ඉක්මවූ ඉතා ඉහළ මිලකට මිලදී ගනිමින් සිදු කළ ගනුදෙනුවක් බව විගණනයේදී නිරීක්ෂණය විය. | | කළයුතු වේ. තවද මේ සම්බන්ධයෙන් මූල්‍ය අක්‍රමිකතාවයන් තිබේද යන්න පරීක්ෂා කර ඒ අනුව නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2.9 කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1970 අංක 33 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථා පනත යටතේ 1971 වර්ෂයේ දී ස්ථාපනය කරන ලද සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව 1992 වර්ෂයේ දී 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ද 2010 වර්ෂයේ දී 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ද නැවත ලියාපදිංචි කර තිබූ අතර එහි දැක්ම “ප්‍රමිතියට අනුකූලව උසස් ගුණාත්මකභාවයෙන් යුක්ත ගොඩනැගිලි ද්‍රව්‍ය හා උපකරණ තරඟකාරී මිලකට දීප ව්‍යාප්තව සැපයීමේ ප්‍රමුඛයා වීම හා රාජ්‍ය ආයතනයක් ලෙස සමාජ වගකීම් ඉටු කරමින් ශ්‍රී ලංකා ප්‍රජාව තුළ උපරිම විශ්වාසනීයත්වයක් ගොඩනැගීම” වේ. එහි ප්‍රධාන කාර්යයන් ලෙස රජයේ සහ පෞද්ගලික අංශයේ ගොඩනැගිලි සහ අනෙකුත් ඉදිකිරීම් වැඩ පිළිවෙල පදනම් කරගෙන ගොඩනැගිලි ද්‍රව්‍ය අවශ්‍යතාවයන් තක්සේරු කිරීම සහ සැපයීම ,ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීමේ මාර්ග සොයා දැන ගැනීම සහ රාජ්‍ය හා පෞද්ගලික අංශවලට නොකඩවා ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, සමුපකාර සමිති, පෞද්ගලික නිවාස ඉදිකරන්නන් සහ සිල්ලර වෙළඳුන් සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනය කිරීම සහ මෙරට නිෂ්පාදිත ගොඩනැගිලි සහ ඉදිකිරීම් ද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ, උපකරණ, මෙවලම් සහ අනෙකුත් | එකඟ වී ඇත. | සමාගම පිහිටුවීමේ අරමුණු හා ප්‍රධාන කාර්යයන් ඉටුවෙන ආකාරයෙන් හා එහි දැක්ම වෙත ළඟා වීමට හැකිවන පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | උපාංග ලංකාව පුරා අලෙවි කිරීම සහ බෙදාහැරීම වේ.<br><br>එසේ වුවද වර්තමානයේ දී සමාගම විසින් සමාගමේ නවීකරණය කරන ලද ප්‍රධාන ප්‍රදර්ශනාගාරයේ පෞද්ගලික ගොඩනැගිලි ද්‍රව්‍ය හා උපකරණ සපයන්නන්ගේ අලෙවි කුටි ප්‍රදර්ශනය කර ඇති අතර ඔවුන්ගේ ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගෙන ලාභ ආන්තිකයක් ඇතිව විකිණීම, සමාගමේ ශාඛා කාර්යාල මඟින් ප්‍රධාන කාර්යාලයෙන් යවනු ලබන සිමෙන්ති, ෂීට් හා යකඩ නියම කරනු ලබන මිලකට විකිණීම, ප්‍රදර්ශනාගාරයේ නොමැති භාණ්ඩ බාහිර වෙළෙඳපොළෙන් මිලදී ගෙන ලාභ ආන්තිකයක් ඇතිව විකිණීම, සහ ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ නමින් වෙනත් ආයතන විසින් ආනයනය කරන ලද ටයිල් විකිණීම වැනි සීමිත ව්‍යාපාර කටයුතුවල පමණක් නිරත වී තිබුණි. | | |
| (ආ) | සමාගම පවත්වාගෙන යාමේ අරමුණු අතරින් උසස් ප්‍රමිතියෙන් යුත් ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම මඟින් වෙළඳපලේ ප්‍රමුඛයා වීම, ප්‍රමිතියෙන් යුත් ගොඩනැගිලි ද්‍රව්‍ය දේශීයව නිෂ්පාදනය කිරීමට දිරි ගැන්වීම මඟින් භාණ්ඩ මිලදීගැනීමේ සහ බෙදාහැරීමේ වෙළඳපල පුළුල් කර ගැනීම යන අරමුණු ඉටුකර ගැනීමට හෝ ඉදිරියේදීද ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට හෝ සැලැස්මක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය නොවිය. | ගැණුම්කරුවන් ඉල්ලුම් කරන ලබන භාණ්ඩ ඔවුන්ගේ රුචිකත්වය පරිදි (සන්නාමය අනුව) ලබා දීමට සිදුවීම සහ ඊට අමතරව බොහෝ නිශ්පාදන හා ඍජු ආනයන සඳහා මුදල් නොගෙවීම මත සමාගම අසාදු ලේඛන ගතකර ඇති බැවින් ඔවුන් සමඟ ව්‍යාපාර සිදුකිරීමට නොහැකිවීම වැනි තත්ත්වයක් ඇති වී ඇත. ආයතනයේ පවතින ප්‍රාග්ධන ඌනතාවය සහ සම්පත් හිඟතාවය නිසා දේශීය නිෂ්පාදන දිරිගැන්වීම හා භාණ්ඩ මිලදීගැනීමේ සහ බෙදාහැරීමේ වෙළඳපල පුළුල් කිරීම යන කරුණු සාක්ෂාත් කරගැනීමට ආයතනයට හැකියාව ලැබී නොමැත. | සාංගමික ව්‍යවස්ථාවලිය පරිදි සමාගමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා උපාය මාර්ගික සැලැස්මක් සකස් කර ඒඅනුව කටයුතු කළ යුතු බව. |

## 2.10. වාහන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2025 ජූලි 28 විගණිත දිනවන විට සමාගම සතු වාහන 12 අතුරින් වාහන 06 ක් ධාවන තත්ත්වයේ නොපැවතිණි. | කළමනාකාරිත්වය අදහස් දක්වා නොමැත. | අළුත්වැඩියා කළ හැකි තත්ත්වයේ වාහන අළුත්වැඩියා කිරීමට හා අනෙකුත් වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අංක 226-3173 දරන ලොරි රථය 2014 වර්ෂයේ සිට ධාවනයෙන් ඉවත් කර තිබුණු අතර, දැනට දිරාපත් වෙමින් පරිශ්‍රයේ ගාල්කර තිබෙන අතර 2024 වර්ෂයේදීද අපහරණය කිරීමට පියවර ගෙන නොතිබුණි. | මේ වන තෙක් අපහරණය කර නොමැත. අපහරණය සඳහා වන රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 13.2 වගන්ති ප්‍රකාරව කටයුතු කළ වුවත් මේ වන තෙක් ඒ සම්බන්ධව කටයුතු කර නොමැත. අපහරණය සඳහා නොපමාව කටයුතු කරනු ඇත. | අපහරණය කළ යුතු වත්කම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | අංක 251 – 9413 දරන කැබ් රථය අළුත්වැඩියාව සඳහා 2019 ජූලි 23 දින ගිවිසුමකට එළඹ රු.මිලියන 0.51 ක් අත්තිකාරම් ලෙස සේවාදායක ආයතනය වෙත ගෙවා තිබුණ ද අළුත්වැඩියා නොකොට ආයතන පරිශ්‍රයේ ගාල් කර තිබුණි. 2025 ජුනි 30 දින වන විට සේවාදායක ආයතනය රු.මිලියන 0.18 ක මුදලක් අය කරගෙන තිබුණද ඉතිරි රු.මිලියන 0.32 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට අදාළ පාර්ශවයෙන් මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇත. රු.මිලියන 0.51 ක මුදලින් මේ වන විට රු.මිලියන 0.18 ක මුදලක් ආයතනය වෙත ලැබී ඇත. | කැබ් රථය අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට නොපමාව කටයුතු කළ යුතු අතර ඉතිරි අත්තිකාරම් මුදල් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමද සිදු කළ යුතුය. |

**2.11 අග්‍රාමාත්‍ය / පස්වන විධායක ජනාධිපති නිල නිවසේ අළුත්වැඩියා හා නවීකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 සැප්තැම්බර් 27 දින ඉදිරිපත් කරන ලද අංක 21/0084/302/002 අමාත්‍ය මණ්ඩල සංදේශයට 2021 ඔක්තෝබර් 26 දිනැති අංක අමප 21/1779/302/002/-1 අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අග්‍රාමාත්‍ය/ පස්වන විධායක ජනාධිපති නිල නිවසේ අළුත්වැඩියා හා නවීකරණ කටයුතු සඳහා අනුමැතිය ලබා දී තිබුණි. ඉහත අළුත්වැඩියා හා නඩත්තු කිරීමට අදාළව සමාගම විසින් භාණ්ඩ සැපයීම වෙනුවෙන් රු.මිලියන 639.22 ක් වටිනා ඉන්වොයිස් 2024 මැයි 14 දින වන විට නිකුත්කර තිබුණි. මෙම නවීකරණ කටයුතු සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව ගිවිසුම්ගතවීමක් නොමැතිව රු.මිලියන 13.07 ක මුදලක් ගෙවීමට එකඟවෙමින් ගෘහ නිර්මාණ ශිල්පියෙකු තෝරාගෙන තිබුණි. එම නිලධාරියාගේ වාචික උපදෙස් මත මෙම ව්‍යාපෘතියට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමට ඔහු විසින් නම් කරනු ලැබූ සැපයුම්කරුවන් 16 දෙනෙකුගෙන් තරඟකාරී මිල කැඳවීමකින් තොරව ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ ගැනුම් ඇනවුම් මත විජේරාම නිල නිවාස ව්‍යාපෘතියට භාණ්ඩ නිකුත්කර ඉන්වොයිස් කර තිබුණු බව නිරීක්ෂණය විය. | ඉදිරියේ දී මෙවැනි ආකාරයේ ගනුදෙනු වලදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කෙරෙනු ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය කර තරඟකාරී මිල ගණන් කැඳවීම මඟින් මිලදී ගැනීම් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නිකුත් කර තිබූ ඉන්වොයිස් වටිනාකමින් රු.මිලියන 559.59 ක අගයක් අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රතිපාදන මත ඒකාබද්ධ අරමුදලින් ප්‍රතිපූරණය කර තිබුණු අතර මෙම වියදම්වලින් රු.මිලියන 110.84 ක් 2026 මාර්තු 20 දිනවන විටත් අග්‍රාමාත්‍ය කාර්යාලය පියවා නොතිබුණි. | අභ්‍යන්තර විගණනයට අනුව රු.මිලියන 110.84 ක මුදලක් අයකර ගත යුතුව ඇති බව අනාවරණය වී ඇත. | අයවිය යුතු මුදල් අය කරගෙන ගනුදෙනු නිරවුල් කර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

**2.12 සිමෙන්ති ආනයනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් මැදිහත් වීම මගින් සිමෙන්ති ආනයනය සඳහා ආනයනය කරන සමාගම්වලින් මිලගණන් කැඳවා, මිල ගණන් එවා තිබූ සමාගම් අතරින් එක් සමාගමක් සමඟ ගිවිසුම්ගත වන ලෙසටත් ඒ වෙනුවෙන් අත්තිකාරම් මුදල් ලෙස රු.මිලියන 05 ක් ගෙවන ලෙසත් රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ඉදිකිරීම්) ලබාදුන් උපදෙස් මත 2022 මාර්තු 14 දින එවකට සිටි සභාපති විසින් සමාගමක් සමඟ ගිවිසුම්ගත වී ගෙවීම් කර තිබුණි. රටේ පවතින විනිමය අර්බුදය හමුවේ ණයවර ලිපි විවෘත කිරීම මහජන බැංකුව ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් සිමෙන්ති ආනයනය කළ නොහැකි වූ අතර ඒ පිළිබඳව කලින් තහවුරු කර ගැනීමකින් තොරව ගෙවා තිබූ රු.මිලියන 05 නැවත අයකර ගැනීමට නොහැකි වී තිබුණි.<br><br>මේ සම්බන්ධයෙන් මූලික විමර්ශනය සිදු කිරීමට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශ ලේකම්ගේ ඉල්ලීම මත රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් පාලන අමාත්‍යාංශයේ විමර්ශන නිලධාරියෙකු පත්කර තිබුණි. ඔහුගේ 2023 සැප්තැම්බර් 26 දිනැති වාර්තාවේ නිර්දේශය අනුව ආනයන කටයුත්තේදී සමාගමට සිදු කළ අලාභය සම්බන්ධයෙන් වගකිව යුතු ඉහත ගිවිසුම අත්සන් කළ සේවයෙන් ඉවත්ව ගොස් ඇති නිලධාරින්ට එරෙහිව පොදු දේපල පනත යටතේ කටයුතු කර එම අලාභය අයකර ගැනීමට කටයුතු කරන ලෙස දක්වා තිබුණද එම නිර්දේශයන්ද ක්‍රියාත්මක කිරීමට මේ වන තෙක්ම කටයුතු කර නොතිබුණි. | අදාළ ව්‍යාපෘතිය වෙනුවෙන් සැපයුම් නොකිරීම මත මෙම මුදල ආපසු අය කර ගැනීම සඳහා පුද්ගලික ආයතනය වෙත ලිඛිත ඉල්ලීමක් කර ඇත. සැපයුම්කරුගේ පිළිතුරු ලිපිය හරහා ආයතනය මඟින් ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වීමක් සිදු නොවූ බැවින් මෙම තැන්පතුව නැවත ලබා දීම ප්‍රතික්ෂේප කර ඇත.මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට ආයතනයේ නීති අංශ මඟින් දැක්වූ කරුණු අනුව ප්‍රථමයෙන්ම වංචා විමර්ෂණ අංශයට හෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට හෝ අල්ලස් හෝ දූෂණ විමර්ශන අංශය වෙත පැමිණිලි කිරීමට කටයුතු කරනු ලැබේ. පැමිණිලි විමර්ශනයෙන් පසුව නෛතික ක්‍රියාමාර්ග ගත යුතු ආකාරය සම්බන්ධව එම ආයතන ඒකාබද්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත. | විමර්ශන වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක නොකිරීමට හේතු වූ කරුණු හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් නිසි පියවරක් ගැනීමට හා සමාගමට අයවිය යුතු මුදල් නොපමාව අයකර ගැනීමට විධිමත් පියවරක් ගත යුතුය. |

## 2.13 ආයතනයේ සේවකයන් වෙත ණය පදනම මත භාණ්ඩ සැපයීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනය විසින් විධිමත් අනුමැතියකින් හා විධිමත් ක්‍රමවේදයකින් තොරව මාසික වැටුපෙන් අයකර ගැනීමේ පදනම මත සමාගමේ සේවකයින්ට ගොඩනැගිලි ද්‍රව්‍ය ලබා දී තිබූ අතර 2024 දෙසැම්බර් 30 දින වනවිට රු.මිලියන 1.31 ක මුදලක් සේවකයින් 08 දෙනෙකුගෙන් අයවීමට පවතින බව නිරීක්ෂණය විය. මේ මගින් මෙම භාණ්ඩ බාහිර පාර්ශවයන්ට විකුණා එකවර මුදල් ලබාගත හැකිව තිබූ අවස්ථා අහිමි වී ගොස් තිබුණි. මෙම අගය තුළ කොන්ත්‍රාත් පදනම මත සේවය කර සේවය අතහැර ගොස් තිබූ සේවකයෙකු වෙත ලබාදී තිබුණු රු.මිලියන 0.11 ක් වටිනා භාණ්ඩ වෙනුවෙන් 2025 ජූනි 30 දින වන විට අයවීමට පැවති රු.මිලියන 0.058 ක මුදලක් ද විය. පෙර ලබා දුන් භාණ්ඩ වෙනුවෙන් වූ වටිනාකම අයවී අවසන්වීමටත් පෙර කිසිඳු සීමාවකින් තොරව එම පුද්ගලයාටම නැවතත් භාණ්ඩ ලබාදීමත් සිදුකර තිබුණි. | ණය පදනමට භාණ්ඩ ලබාගැනීම සඳහා සේවකයෙකු විසින් සිදු කරන ලිඛිත ඉල්ලීමට සාමාන්‍යාධිකාරීවරයා විසින් අනුමැතිය ලබා දීමෙන් පසු භාණ්ඩ ලබා දීම සිදු කරනු ලබයි. එහිදීද සාමාන්‍යාධිකාරීවරයා විසින් අනුමැතිය ලබා දීමෙන් පසු භාණ්ඩ ලබා දී ඇත. | හිඟ මුදල් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර ණය පදනම මත සමාගමේ සේවකයින් වෙත ගොඩනැගිලි ද්‍රව්‍ය ලබාදීමට විධිමත් අනුමැතීන් ලබාගෙන ඒ සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කර අවශ්‍ය අනුමැතීන් නොපමාව ලබාගැනීමෙන් පසුව පමණක් එම කටයුතු ක්‍රියාත්මක කළ යුතුය. |

## 2.14 ටයිල් ව්‍යාපෘතිය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රටෙහි විදේශ විනිමය අර්බුදය හේතුවෙන් ආනයන සීමා පනවා ඇති අවස්ථාවක වෙළඳපලෙහි ටයිල් හිඟය අවම කර ගැනීමේ අරමුණින් ටයිල් ආනයනය කිරීමේ අවසරය 2021 ජූනි 11 දිනැති අංක 2231/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් සමාගමට පමණක් ලබාදී තිබුණි. ඒ අනුව සමාගමට ආනයන කටයුතු කිරීමට තරම් මූල්‍ය ශක්තියක් නොමැති වීම හේතුවෙන් එම ව්‍යාපාරයෙහි යෙදී සිටින එම ද්‍රව්‍ය අලෙවියට කැමැත්තක් දක්වන සමාගම් සමඟ අවබෝධතා ගිවිසුම් වලට එළඹ "BMC" නමින් ඔවුන්ගේ මුදලින් ටයිල් ආනයනය කිරීමට එකඟව තිබුණි. ටයිල් ව්‍යාපෘතිය ආරම්භයේ සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාල සීමාව තුළ සිදුකර තිබූ ටයිල් ආනයන වටිනාකම රු.මිලියන 928.88 ක් වූ අතර විකුණුම් වටිනාකම රු.මිලියන 2,695.82 ක් විය.<br><br>2024 දෙසැම්බර් 31 දිනට ආනයනික ටයිල් සඳහා සංස්ථාවට ලැබිය යුතු ලාභය රු.මිලියන 64.84 ක් සහ ආනයනික වියදම් | එකඟ වී ඇත. | ගිවිසුම් අනුව කටයුතු කිරීමට හා ටයිල් අලෙවිය වෙනුවෙන් ලැබිය යුතු මුදල් නිසි පරිදි අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

සංස්ථාවෙන් දැරීම හේතුවෙන් සංස්ථාවට අය විය යුතු රු.මිලියන 22.92 ක් ද ඇතුළුව ලැබිය යුතු මුළු වටිනාකම රු.මිලියන 87.76 ක් විය. ඒ වෙනුවෙන් සැපයුම්කරුවන්ට නොගෙවා රඳවා ගෙන ඇති විකුණුම් වටිනාකම රු.මිලියන 36.37 ක් අඩු කළ විට තව දුරටත් අය විය යුතු ශේෂය රු.මිලියන 51.39 කි. සංස්ථාව සතුව ටයිල් 6979 ක තොගයක් නොවිකිණී ඉතිරිව පැවති අතර එහි වටිනාකම රු.මිලියන 6.46 ක් පමණක් විය.

## 2.15 ආදර්ශ ගම්මාන වැඩසටහන සඳහා සමාගම විසින් ද්‍රව්‍ය නිකුත් කිරීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරනු ලැබූ සූරිය පොකුණ දෙබොක්කාව නිවාස ව්‍යාපෘතිය යටතේ නිවාස හිමියන්ට අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවෙන් නිකුත් කර තිබුණි.<br><br>මේ අනුව ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට අයත් අම්බලන්තොට, තංගල්ල, ලුණුගම්වෙහෙර, තිස්ස, වීරකැටිය, ඇඹිලිපිටිය, සූරියවැව, යන ශාඛා ගබඩාවන්ගෙන් 2016 වර්ෂයේ සිට 2021 දක්වා නිකුත් කර තිබූ ගොඩනැගිලි ද්‍රව්‍ය වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දින දක්වා වූ ණය ශේෂය රු.මිලියන 27.56 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2025 ජූලි 15 දින ගරු ඇමතිතුමා සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සමඟ පැවති සාකච්ඡාවේදී සියලු ලියකියවිලි සහිතව ඉදිරිපත් කරන ලද ලේඛන වලට මසක් ඇතුළත මුදල් ගෙවීමට එකඟ විය. ඒ අනුව 2025 ජූලි 18 වන දින සම්පූර්ණ කරන ලද රු.මිලියන 27.56 ක වටිනාකමකින් යුත් ලේඛන නිවාස සංවර්ධන අධිකාරියට භාර දුන් නමුත් මේ වන තෙක් එම මුදල් ගෙවීමට අදාළ ආයතනය කටයුතු කර නොමැත. | නිකුත් කරන ලද ගොඩනැගිලි ද්‍රව්‍ය වෙනුවෙන් අය විය යුතු මුදල් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

## 2.16 පරිගණක මෘදුකාංගයක් මිලදී ගැනීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පවත්නා පරිගණක මෘදුකාංග පද්ධතිය කාර්යක්ෂම නොවුණ බැවින් නව පරිගණක පද්ධතියක් මිලදී ගැනීමට මිල ගණන් කැඳවා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමකින් තොරව රු.මිලියන 0.98 ක අත්තිකාරමක් සාමාන්‍යාධිකාරීගේ අනුමැතියෙන් 2021 ඔක්තෝබර් 12 දින පුද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි. එසේ වූවද 2024 දෙසැම්බර් 31 දින දක්වාම | අදාළ පුද්ගලික ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් මෙම අත්තිකාරම් මුදල නැවත අයකර ගැනීම සම්බන්ධව යොමුකළ ලිපියට දැක්වූ පිළිතුරු අනුව මේ වන විට ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර ඒ සඳහා වන මූලික අදියරේ වැඩකටයුතු සඳහා ආයතනික වශයෙන් මූල්‍යමය සහ ශ්‍රම පිරිවැයක් දරා ඇති බවටත් ව්‍යාපෘතියේ මීළඟ අදියර | සමාගමේ අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි පරිගණක පද්ධතියක් මිලදී ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතු වේ. එසේම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ |

| | | |
|---|---|---|
| සමාගමට උචිත පරිගණක මෘදුකාංගයක් මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ගෙවන ලද අත්තිකාරම් නිරවුල් කර ගැනීමටද පියවර ගෙන නොතිබුණි. | ආරම්භ කරමින් එහි පළමු වාරිකය සඳහා ඉන්වොයිස්පත් ගෙවීම් කිරීමට නිකුත් කර ඇති බවටත් දන්වා ඇත. ඒ අනුව ලබා දුන් අත්තිකාරම් මුදල ආපසු ලබා දීමට නොහැකි බවටත් හැකි ඉක්මනින් ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදුකරගෙන යාමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසටත් සමාගමෙන් ඉල්ලා ඇත. | අනුගමනය නොකිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන විනය ක්‍රියාමාර්ග ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

## 2.17 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1998 නොවැම්බර් 09 දිනැති අංක 541 ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10 හි පිහිටි සමාගම සතු ඉඩමෙන් පර්චස් 100 ක ඉඩම් ප්‍රමාණයක් ලංකා බැංකුව වෙත රු.මිලියන 70 කට විකුණුම්කරයක් මගින් පවරා තිබූ අතර, පසුව සමාගම විසින් 2018 ඔක්තෝබර් මස 23 දින ලංකා බැංකුවෙන් ලබා ගන්නා ලද රු.මිලියන 500ක ණය මුදලින් ඉහත විකුණුම්කරයට අදාළ මුදල වන රු.මිලියන 70 ක මුදල සමඟ ණය අයිරා මුදලද ඒ අනුව ගෙවිය යුතු පොළිය ද ඇතුළුව රු.මිලියන 199.05 ක මුදලක් හිලව් කරගෙන තිබුණි. ලංකා බැංකුව ඉහත සඳහන් මුදල් හිලව් කිරීමෙන් අනතුරුව බැංකුව විසින් සකස් කර එවා ඇති ඔප්පුවේ වටිනාකමට අදාළ මුද්දර ගාස්තුව වූ රු.මිලියන 18.40 ක මුදල ගෙවා නැවත ඉඩම පවරාගත යුතු වුවත්, 2025 ජූනි 30 දින වන විටත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩම් කොටස මුද්දර ගාස්තු ගෙවා ඔප්පු ලියවා ගැනීමට ලංකා බැංකුව සමඟ සාකච්ඡා කරන ලද අතර, ඔප්පු ලිවීම සඳහා අවශ්‍ය ලේඛන අතර 2015 වසරේ සිට යාවත්කාලීන නොකරන ලද සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ෆෝරම 20 සහ 15 තිබුණි. 2023 ජූනි මස එම ලේඛන සම්පූර්ණ කළ අතර, මුද්දර ගාස්තුව වූ රු.මිලියන 5.38 ක මුදල පිළිබඳව දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව මගින් නැවත මුද්දර ගාස්තු පිළිබඳ මත විමසුමක් ලබා ගන්නා ලෙස ලංකා බැංකුව දන්වා ඇති අතර පළාත් ආදායම් දෙපාර්තමේන්තුව මගින්, නැවත තක්සේරු කර මුද්දර ගාස්තුව ලෙස රු.මිලියන 23.99 ක් ලෙස දන්වා ඇත. | ඉඩමේ අයිතිය පවරා ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ආ) | මාතර කඩේ වීදිය නැගෙනහිර අංක. 417/ඒ දරන ස්ථානයේ පිහිටි ගොඩනැගිල්ලෙහි කොටසක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් අනවසරයෙන් පරිහරණය කරන අතර සමාගම ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශ ලේකම් මගින් 2024 ජනවාරි 30 දිනැතිව අප ආයතනය වෙත යොමු කර තිබූ ලිපිය මගින් බදු පදනමින් හෝ සින්නක්කර පදනමින් පර්.24 ක බිම් කොටසක් ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත. අදාළ ලේඛන සමඟ අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලෙස දන්වා ඇති අතර යථා කාලයේදී පත්‍රිකාවක් යොමු කිරීමට කටයුතු කරනු ඇත. | අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට හෝ විධිමත් පරිදි ගොඩනැගිල්ල ලබා දීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රූඩ් 03 යි පර්චස් 35.6 ක් වූ අනුරාධපුරයෙහි පිහිටි ඉඩමක නඩු කටයුතු 2013 ජූලි 07 දින අවසන් වී ඇතත් අනවසර පදිංචිකරුවන් ඉවත්කර භුක්තිය භාර ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි. | භුක්තිය භාර ගැනීමට අදාළ ඉදිරි අධිකරණ කටයුතු මේ වන විට සිදුකරමින් පවතී. | වසර 10 කට වැඩි කාලයක සිට නඩු තීන්දුව අනුව සමාගමේ වත්කම් ආරක්ෂා කර නොගැනීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු අතර අනවසර පදිංචිකරු ඉවත්කර භුක්තිය භාර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාගම යටතේ ඇති අක්කර 04 යි රූඩ් 2 යි පර්චස් 17 ක් වටිනා මොරටුව, අනුරාධපුර, අම්පාර, මොණරාගල පිහිටි ඉඩම් වෙනුවෙන් ඔප්පු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඉඩම් සඳහා මිනින්දෝරු සැලසුම්ද සකස් කර නොතිබුණි. | පවතින මූල්‍ය දුෂ්කරතාවය හමුවේ මේ වන තෙක් සඳහන් කර ඇති ඉඩම් සහ නිවාස සඳහා මිනින්දෝරු සැළැසුම් ලබා ගැනීමට නොහැකි වී ඇත. | මිනින්දෝරු සැලසුම් සකස්කර ඔප්පු ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | මොරටුව බොරුපන අංක 549/A හි පිහිටි ඉඩමේ අයිතිය 2019 අගෝස්තු 21 දිනැතිව සහ අංක අමප/19/2192/122/076 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් සමාගම වෙත ලබාදීමට අනුමත කර ඇතත් සමාගම විසින් ඉඩමේ අයිතියට අදාළ ඔප්පුව සකස්කර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | ඉඩමේ අයිතිය පවරා ගැනීමට අවශ්‍ය ලේඛන මේ වන විට ඉඩම් අමාත්‍යාංශය වෙත අමාත්‍යතුමාගේ අනුමැතියට යොමු කර ඇත. | ඉඩමේ අයිතිය සමාගම වෙත ලබා ගැනීමට අදාළ ඔප්පුව සකස්කර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ඊ) | සමාගම සතු කුන්ගුනියාර් උප්පුකුලම් කරෙයි යාපනය පිහිටි රූඩ් 01යි පර්චස් 31.6 ක ඉඩම, නුවරඑළිය බඹර කැලේ ගොඩනැගිල්ල සහ ඇඹිලිපිටිය යෝධගම පිහිටි නිවාස 02 ක් 2017 වර්ෂයේ සිට උපයෝජනය නොකර නිශ්ක්‍රීයව පැවතුණි. | යාපනයේ ඉඩම සංවර්ධනය කළ යුතු අතර අනුරාධපුර පණ්ඩුලගම නිවාස, ඇඹිලිපිටිය යෝධගම නිවාස දෙක, නුවරඑළිය බඹරකැලේ ගොඩනැගිල්ල භාවිත කිරීම සඳහා අළුත්වැඩියා කිරීම සිදුකළ යුතු වේ. ආයතනයේ පවතින මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් යාපනයේ ඉඩම, අනුරාධපුර පණ්ඩුලගම නිවාස, ඇඹිලිපිටිය යෝධගම නිවාස දෙක, නුවරඑළිය බඹරකැලේ ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමට නොහැකි වී ඇත. | භාවිතයට නොගෙන නිශ්ක්‍රීයව පවතින ඉඩම් හා ගොඩනැගිලි ඵලදායී කාර්යයන් සඳහා යොදා ගැනීමට කාර්යක්ෂම වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ කළ යුතුය. |
| (උ) | මහවැලි අධිකාරිය විසින් 50 අවුරුදු බද්දකට ලබාදී ඇති ඇඹිලිපිටිය රූඩ් 01ක ඉඩම වෙනුවෙන් 1997 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා ගෙවීමට තිබූ හිඟබදු මුදල හා දඩය රු.මිලියන 1.79 ක් විය. මෙම | මෙම හිඟබදු මුදල හා දඩය ආයතනයේ පවතින මූල්‍ය දුෂ්කරතාවය මත මෙතෙක් ගෙවීම් කිරීමට කටයුතු කර නොමැත. | බදු ගිවිසුම ප්‍රකාර හිඟ බදු මුදල් ගෙවීමට හෝ අධිකාරිය සමඟ සාකච්ඡා කර සුදුසු |

| | | | |
|---|---|---|---|
| | බදු මුදල් මේ දක්වා නොගෙවීම හේතුවෙන් බද්ද අවසන් විය හැකි බවටත්, නීතිය මගින් කටයුතු කරන බවත් මහවැලි අධිකාරිය දන්වා එවා තිබුණ ද සමාගම බදු ගිවිසුම ප්‍රකාරව බදු මුදල් ගෙවා නොතිබුණි. | | වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට නොපමාව කටයුතු කළ යුතුය. |

**2.18 සමාගම සතු දේපළ කුළී පදනම මත බාහිර පාර්ශවයන්ට ලබා දීම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නව තක්සේරු වටිනාකමක් ලබා නොගෙන වර්ෂ 05 කට වැඩි පැරණි මිල ගණන්වලටම සමාලෝචිත වර්ෂයේදීද සිමෙන්ති ගබඩාව, අංක 06 ගබඩාව සහ සංසරාජ අංක 11 ගබඩාව කුලියට ලබා දීමට කටයුතු කර තිබුණි. | ඉදිරියේ දී නව මිල ගණන් යටතේ ගිවිසුම්ගත වීමට කටයුතු සිදු කරනු ඇත. | නව තක්සේරු වටිනාකම මත ගොඩනැගිලි කුලියට ලබා දීමට හා සමාගමට වාසිදායක ලෙස වත්කම් කුලියට ලබාදීමට කටයුතු නොකළ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමද සිදුකළ යුතුය. |
| (ආ) | මාතර ලංකා සතොස අලෙවි සැල සඳහා කුලියට ලබා දී තිබුණු සමාගම සතු ගොඩනැගිල්ලක් නැවත කුලියට ලබා දීමට පියවර නොගෙන වර්තමානය දක්වා ඌන උපයෝජිතව පවතී. | ඉදිරියේ දී නව මිල ගණන් යටතේ ගිවිසුම්ගත වීමට කටයුතු සිදු කරනු ඇත. | ගොඩනැගිල්ල විධිමත් ගිවිසුමක් මත කුලියට ලබා දීමට නොපමාව පියවර ගත යුතුය. |
| (ඇ) | සංසරාජ ප්‍රදර්ශනාගාරය තුළ වර්ග අඩි 500 ක් පුද්ගලික ආයතනයකට කුළී පදනම මත ලබා දී තිබුණු අතර, එම ආයතනය 2020 ජනවාරි 23 දින ප්‍රදර්ශනාගාරයෙන් ඉවත් වී තිබුණි. එම ආයතනයෙන් අයවිය යුතු රු.මිලියන 0.14 ක මුදලක් සමාගමට අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ආයතනය මගින් අප වෙත අය වීමට ඇති මුදල පිළිබඳව දැනුවත් කිරීමෙන් පසුව එම ආයතනය විසින් එම මුදල කොටස් වශයෙන් ගෙවීම් කිරීමට ඉල්ලීමක් කර ඇති අතර එයට එකඟතාව පලකර ආයතනයේ ගිණුම් අංකය 2023 පෙබරවාරි 09 වන දිනැති ලිපිය මගින් දන්වා ඇතත් මේ වන තෙක් ගෙවීම් කර නොමැත. අයකර ගැනීමට ඇති හැකියාව සොයා බලා අවශ්‍ය කටයුතු කරනු ඇත. | කුළී ගිවිසුම අනුව හිඟ කුළි අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2015 අප්‍රේල් මස සිට වර්ග අඩියක් රු.45 බැගින් වර්ග අඩි 1480 ක් වූ අංක 541 ශ්‍රී සංසරාජ මාවතේ සමාගම් පරිශ්‍රයේ සමාගම සතු ගබඩාවක් මසකට රු.මිලියන 0.066 ක මුදලකට එක් පුද්ගලයකු වෙත කුලියට දී | එවකට ආයතය සතුව නීති නිලධාරියෙකු නොමැති වීම නිසාවෙන් නව ගිවිසුම් ගත වීමක් සිදු කිරීමට නොහැකි වී ඇත. මේ වන විට නව ගිවිසුමක් වෙත එළඹීමට | නව තක්සේරු වටිනාකම මත ගොඩනැගිලි කුලියට ලබා දීමට හා සමාගමට වාසිදායක ලෙස |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. ගිවිසුම් කාලය 2017 අප්‍රේල් 09 දින දක්වා වූ අතර නව ගිවිසුමකට එළඹීමකින්ද තොරව මුල් ගිවිසුම අනුව පැවති කුලී මුදලටම 2024 දෙසැම්බර් 31 දින දක්වාම කුලියට ලබා දී තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමිව ඇත. | වත්කම් කුලියට ලබාදීමට කටයුතු නොකළ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමද සිදුකළ යුතුය. |
| (ඉ) | ජාතික යොවුන් සේනාංක (National Youth Crops) ආයතනය වෙත මසකට රු.මිලියන 0.16 කට කුලියට ලබා දී තිබූ මාලිගාව පාර රත්මලාන පිහිටි ගොඩනැගිල්ල 2019 ඔක්තෝබර් මස සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා නිෂ්ක්‍රීයව පැවතුණි. | කළමනාකරණය අදහස් දක්වා නොමැත. | නිෂ්ක්‍රීය වත්කම් භාවිතයට ගැනීමට හෝ කුලියට ලබාදීමට කටයුතු කළ යුතුය. |

## 2.19 බාහිර පාර්ශවයන්ගෙන් කුලී පදනම මත ලබාගෙන ඇති ගබඩා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම විසින් ත්‍රිකුණාමලය, කුලියාපිටිය, කුරුණෑගල හා තංගල්ල අලෙවි මධ්‍යස්ථාන කුළී පදනම මත ලබාගත් ගොඩනැගිලිවල පවත්වාගෙන යමින් පැවති අතර තංගල්ල අලෙවි මධ්‍යස්ථානය සඳහා රු.මිලියන 0.035 ක මාසික කුළියක්ද අනෙකුත් මධ්‍යස්ථාන සඳහා රු.මිලියන 0.030 ක් බැගින් ගෙවීමට සමාගම ගොඩනැගිලි හිමිකරුවන් සමඟ ගිවිසුම් ගත වී තිබුණි. මෙම ගොඩනැගිලි කුලියට ලබා ගැනීමේ දී කුලි මුදල් තක්සේරු කරනු ලැබුවේ කුමන පදනමක් මතද යන්න විගණනයට තහවුරු නොවීය. 2024 දෙසැම්බර් 31 වන විට තංගල්ල අලෙවි මධ්‍යස්ථානය වසා දමා තිබූ අතර 2025 ජූනි 30 දින වන විට අනෙකුත් මධ්‍යස්ථාන සියල්ල අලාභ ලබමින් පවත්වාගෙන යමින් පැවතුණි. | තංගල්ල අලෙවි මධ්‍යස්ථානය සඳහා රු.මිලියන 0.035 ක මාසික කුළියක් ද, කුරුණෑගල හා කුලියාපිටිය රු.මිලියන 0.030 ද, ත්‍රිකුණාමලය රු.මිලියන 0.025 ක මුදලක් ද ගෙවයි. ඉදිරියේ දී අලෙවි මධ්‍යස්ථාන කුළී පදනම මත ලබා ගැනීමේ දී විනිවිදභාවයෙන් යුතුව මේ පිළිබඳ උනන්දුවක් දක්වන සියලුම පාර්ශවයන්ට අවස්ථාවක් ලබා දීමට කටයුතු කරනු ඇත. | අත්‍යවශ්‍ය අවස්ථාවලදී පමණක් නිසි අනුමැතීන් මත කාර්යක්ෂම හා ඵලදායී ප්‍රසම්පාදන ක්‍රමවේදයන් යටතේ ගොඩනැගිලි කුලියට ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.20 බැංකු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම විසින් බැංකු ගිණුම් 11 ක් පවත්වාගෙන යනු ලබන අතර ඉන් ගිණුම් 09 සක්‍රියව ද ගිණුම් 02 ක් අක්‍රියව ද පැවතුණි. 2024 වර්ෂය සඳහා ආරම්භක සහ අවසාන ශේෂයන් සඳහන් කරමින් නිවැරදිව මුදල් පොත් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර බැංකු සැසඳුම් පිළියෙල කිරීමේදී මුදල් පොතේ ශේෂය වෙනුවට බැංකු ප්‍රකාශනයේ ශේෂය පදනම් කර ගනිමින් සත්‍ය ලෙස මුදල් පොතේ ශේෂය හා බැංකු ප්‍රකාශනයේ | බැංකු ගිණුම් සඳහා ලැබීම් මුදල් පොත් හා ගෙවීම් මුදල් පොත් වෙන වෙනම පවත්වා ගෙන යනු ලබයි. 2024 ජනවාරි 01 දිනට පැවති බැංකු ශේෂය පදනම් කර ගනිමින් 2024 වර්ෂයේ ජනවාරි සිට 2025 සැප්තැම්බර් මාසය තෙක්ම මුදල් පොතේ ශේෂය හා බැංකු ප්‍රකාශනයේ ශේෂය සංසන්දනය වන | බැංකු සැසඳුම් ප්‍රකාශ නිවැරදිව පිළියෙල කරමින් මුදල් හා බැංකු ගනුදෙනුවල අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ |

| | | |
|---|---|---|
| ශේෂය සංසන්දනය නොවන අයුරින් සැසඳුම් පිළියෙල කර තිබුණි. | අයුරින් බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙළ කර ඇත. | යුතුය. |

## 2.21 විභාග වෙමින් පවතින නඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 දෙසැම්බර් 30 දින වන විට ගෙවීමට පැවති රු.මිලියන 24.27 ක හිඟ මුදල් ඉල්ලා සැපයුම්කරුවන් දෙදෙනෙකු සමාගමට එරෙහිව දිසා අධිකරණයේ නඩු 02 ක් පවරා තිබුණු අතර නීතිඥ ගාස්තු සඳහා අමතර පිරිවැයක් දැරීමට සමාගමට සිදු වී තිබුණි. | අදහස් දක්වා නොමැත. | නොපමාව සැපයුම්කරුවන්ගේ හිඟ මුදල් ගෙවීමට කටයුතු කර අනාර්ථික වියදම් පාලනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.22 ස්ථාවර තැන්පත් හා ඉතුරුම් ගිණුම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.මිලියන 22 ක් වූ ස්ථාවර තැන්පතු ගිණුම් 04 ක් හා රු.මිලියන 05 ක ඉතුරුම් ගිණුමක්ද ඇපයට තබා සමාගම විසින් රු.මිලියන 24.30 ක අයිරා පහසුකමක් ලබා ගෙන තිබූ අතර 2024 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 13.01 ක අයිරා ශේෂයක් පැවතුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී බැංකු ගිණුම් 03 ක් වෙනුවෙන් අයකර තිබූ අයිරා පොලිය රු.මිලියන 0.95 ක් විය. | ආයතනයේ පිරිවැය අවම කර ගැනීම සඳහා ස්ථාවර තැන්පතු සහ ඉතිරි කිරීමේ තැන්පතු ඇප මත ලබාගෙන තිබූ සියලු අයිරා පහසුකම් ගෙවා අවසන් කිරීමට 2025 ඔක්තෝබර් 07 දින කටයුතු කර ඇත. | විධිමත් මූල්‍ය පාලනයක් පවත්වාගෙන යාමට කටයුතු කිරීම තුළින් අනාර්ථික වියදම් පාලනය කරගත යුතුය. |

## 3. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.1 හා 3.2 වගන්ති ප්‍රකාරව සේවක මණ්ඩලය, වැටුප් පරිමාණයන් හා බඳවා ගැනීමේ පරිපාටිය මේ දක්වා අනුමත කරගෙන නොතිබුණු අතර | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කරන ලද කාර්යය මණ්ඩල ඇස්තමේන්තුවක් මෙම ආයතනයේ නොමැති වූ බැවින්, සේවක 350 කින් සමන්විත කාර්යය මණ්ඩල | අමාත්‍ය මණ්ඩල තීරණ හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව සේවක මණ්ඩලය අනුමත කරවා ගැනීම |

| | | | |
|---|---|---|---|
| | 2022 අප්‍රේල් 19 දිනැති පොදු ව්‍යාපාර කාරක සභාවේ නියෝග අංක 07 හා 16 මගින් ද සේවක මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු බව නිර්දේශ කර තිබුණි. | ඇස්තමේන්තුව සකස් කර 2022 මාර්තු 02 දාතමින් ග්‍රාමීය නිවාස ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියක් යොමු කරන ලදී. ඒ සම්බන්ධයෙන් පවත්වන ලද රැස්වීමකදී කාර්යමණ්ඩල ඇස්තමේන්තුව සංශෝධනය කරන ලෙස ලබාදෙන ලද උපදෙස් වලට අනුව 245 කින් සමන්විත කාර්යමණ්ඩල ඇස්තමේන්තුව සකස්කර 2022 ජුනි 08 දාතම ලිපියක් මඟින් යොමුකරන ලදී. | සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර අවශ්‍ය ක්‍රියාමාර්ග නොපමාව ගත යුතුය. |
| (ආ) | කාර්ය මණ්ඩල ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා ගැනීම මැයෙන් 2024 දෙසැම්බර් 24 දිනැති අංක MUDH/HC/AD/176/14 දරන නාගරික සංවර්ධන ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියට පිළිතුරු වශයෙන් 2025 ජූනි 16 දිනැති අංක DMS/1734/V-III දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙන් දන්වා තිබුණේ 2023 සැප්තැම්බර් 05 දිනැති අංක අමප/23/1483/604/030-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක නොකරන්නේ නම් ආයතනයේ ඉදිරි පැවැත්ම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඒ පිළිබඳව කටයුතු කළ යුතු බවයි. සමාගම මේ සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ගය විගණනයට ඉදිරිපත් නොවීය. | එකඟ වී ඇත. | -එම- |
| (ඇ) | 2016 මාර්තු 08 දිනැති අංක 02/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ (2) වගන්තිය ප්‍රකාරව රජය සතු ව්‍යවසායන්හි සිටින සේවක සංඛ්‍යාව හා අතිරික්ත සේවක සංඛ්‍යාව සම්බන්ධයෙන් ඇගයීමක් කළ යුතු අතර එසේ හඳුනාගන්නා අතිරේක කාර්යමණ්ඩලය සම්බන්ධයෙන් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතු වුවද කාර්යමණ්ඩලය සම්බන්ධයෙන් එවැනි ඇගයීමක් කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි. | කාර්යමණ්ඩල ඇගයීමක් ඉදිරියේදී සිදුකිරීමට පියවර ගනු ඇත. | සමාගමේ සිටින අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව ඇගයීමක් කර චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව කාර්ය මණ්ඩලය පිළිබඳ විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | 2022 පෙබරවාරි 14 දිනැති අංක 4.2/28 දරන සමාගමේ සාමාන්‍යාධිකාරීගේ ලිපිය අනුව අභ්‍යන්තර විගණක තනතුර ස්ථිර කර තිබුණි. | ඉදිරියේ දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියද සහිතව නිවැරදි කර ගැනීමට බලාපොරොත්තු | අභ්‍යන්තර විගණකගේ අවශ්‍යතාව |

| | | | |
|---|---|---|---|
| | එසේ වුවද එම ස්ථිර කිරීම 2022 පෙබරවාරි 07 දින අංක 288/36 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයෙන් අනුමත කර තිබුණද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට දැනුම් දී අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. 2022 සැප්තැම්බර් 20 දින අංක DMS/1734/V-II Temp දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව මෙම තනතුරට කොන්ත්‍රාත් පදනමට බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා දී තිබුණු අතර 2022 සැප්තැම්බර් 20 දින සිට 2025 ජූනි 30 දින දක්වා වරින් වර කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සඳහාද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියද ලබා දී තිබුණි. මෙම තත්ත්වය මේ දක්වා නිවැරදි කර ගැනීමට සමාගම පියවර ගෙන නොතිබුණි. | වනු ඇත. | හඳුනාගෙන ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත සුදුසු නිලධාරියකු බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාගමේ ප්‍රාග්ධනය මහා භාණ්ඩාගාරය විසින් යොදවා ඇති අතර 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි සමාගමක් වේ. එහි සාංසමික ව්‍යවස්ථාවලියෙහි 78 වන වගන්තිය ප්‍රකාරව මුදල් අමාත්‍යවරයා හා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යවරයා විමසා භාණ්ඩාගාර ලේකම් විසින් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය පත්කළ යුතු වුවද, 2023 හා 2024 වර්ෂයන්හි අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම් ලිපි නිකුත්කර තිබුණේ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයාගේ අනුමැතිය මත අමාත්‍යාංශ ලේකම් විසිනි. | මේ වන විට නිසි ක්‍රමවේදයන්ට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය පත් කර ඇත. | සමාගමේ සාංසමික ව්‍යවස්ථාවලියට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීමට කටයුතු කළ යුතුය. |

**4 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 5.3 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අයවැය ලේඛනයක් පිළියෙල කර අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වී ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව වර්ෂය ආරම්භ වීමට පෙර අයවැය ලේඛනයක් පිළියෙල කර අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**4.2 උපායමාර්ග සැලැස්ම /ක්‍රියාකාරී සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදුන් මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 වගන්තිය ප්‍රකාරව සමාගමේ දැක්ම හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා උපායමාර්ගික සැලැස්මක් හා ඊට අනුරූපීව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර සෑම මුදල් වර්ෂයක් ආරම්භවීමට දින 15 කට පෙර අදාළ සැලසුම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු වුවත් එසේ කර නොතිබුණි.<br><br>එමෙන්ම මාර්ගෝපදේශය ප්‍රකාරව සමාගමෙහි කාර්යයසාධනය සම්බන්ධයෙන් තහවුරුවක් ලබා ගනිමින් අවශ්‍ය අවස්ථාවන්හිදී මහාභාණ්ඩාගාරය සමඟ එහි ගැටළුසහගත තත්ත්වයන් පිළිබඳ සාකච්ඡා කිරීමටද කටයුතු කර නොතිබුණි. | 2023 ඔක්තෝබර් 11 දින වර්ෂ 2024 සිට 2026 දක්වා උපායමාර්ගික සැලැස්මක් හා ඊට අනුරූපීව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර රේඛීය අමාත්‍යාංශයට භාර දී ඇති බව තොරතුරු විමසීමේ දී අනාවරණය වී ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව වර්ෂය ආරම්භ වීමට පෙර උපායමාර්ග සැලැස්මක් හා ඊට අනුරූපිව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**4.3 අභ්‍යන්තර විගණනය හා විගණන කළමනාකරණ කමිටු පැවැත්වීම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම 2024 ජනවාරි 31 දින සභාපතිවරයා විසින් අනුමත කර එවා තිබූ අතර විගණන සැලැස්ම අනුව විගණන ක්ෂේත්‍රයන් 24 ක් ආවරණය කිරීමට සැලසුම් කර තිබුණද සැලසුම් 08 ක් පමණක් ආවරණය කර තිබුණි. 2024 වර්ෂයේ ඉටුකළ යුතු යැයි නිශ්චිතව හඳුනාගත් ක්‍රියාකාරකම් වලින් සියයට 66 ක් අදාළ කාලපරිච්ඡේදයේදී ඉටුකර නොතිබුණි. | අමාත්‍යාංශය විසින් ගිණුම් පිළියෙළ කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශයේ සහාය ලබා ගත් බැවින් සහ විගණන විමසුම් ඇතුළු විගණනයට අදාළ සියලු රාජකාරීන් විගණන අංශයෙන් සිදු වූ බැවින්, විගණන සැලැස්මට අදාළ බොහෝ කටයුතු මගහැරී ඇත. තවද, සේවක හිඟය ද, මෙයට බලපා ඇති අතර ඉදිරියේ දී විගණන සැලැස්මට අනුව කටයුතු කරනු ඇත. | අනුමත විගණන සැලැස්ම ප්‍රකාරව වාර්ෂික අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම් ඉටු කිරීමට හා එම වාර්තා විගණකාධිපති වෙත යොමු කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මාර්ගෝපදේශයේ ඇමුණුම් IV හි 4 (ආ) වගන්තිය යටතේ වූ කරුණු සම්බන්ධයෙන් ඇගයීම් කිරීම සඳහා එහි 3 වන වගන්තිය පරිදි සහ 2018 අංක 19 දරන ජාතික විගණන | 2024 පෙබරවාරි මස සිට කමිටුව සඳහා සණ පූර්ණය නොමැති බැවින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි විය. නමුත් සණ පූර්ණය නොමැතිව 2024 සැප්තැම්බර් 03 වන දින කමිටු රැස්වීම පවත්වන ලදී. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට හා එමඟින් අභ්‍යන්තර පාලනය |

පනතේ 41 වගන්තිය පරිදි විගණන සැලැස්මෙහි ප්‍රගතිය පරික්ෂා කිරීම විගණන හා කළමනාකරණ කමිටු මඟින් සිදු කළ යුතුව තිබුණද 2024 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 01 ක් පමණක් 2024 අගෝස්තු 22 දින පවත්වා තිබූ බැවින් ප්‍රගතිය පරික්ෂා කිරීමට නොහැකි වී තිබුණි.

මේවන විට ද, අධ්‍යක්ෂ මණ්ඩලයක් නොමැති බැවින් 04 වන කාර්තුවට අදාළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීමට නොහැකි වී ඇත. 2025 වර්ෂයට අදාළව 2025 මැයි 09 සහ 2025 මැයි 12 යන දින 02 හි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පවත්වා ඇත. ආයතනයේ පැවති මූල්‍ය අර්බුදය හේතුවෙන් 03 වන කාර්තුවේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්විය නොහැකි විය. හතරවන කාර්තුවට අදාළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2025 නොවැම්බර් 18 දින පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

ශක්තිමත් කිරීමට සමාගම විසින් කටයුතු කළ යුතුය.